

ශ්‍රී ලංකා නාවික හමුදාව

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2023

2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව
ශ්‍රී ලංකා නාවික හමුදාව
වැය ශීර්ෂය 223

අන්තර්ගතය **පිටු අංකය**

පරිච්ඡේදය 01	- ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය	3-8
පරිච්ඡේදය 02	- ප්‍රගතිය හා ඉදිරි දැක්ම	9-27
පරිච්ඡේදය 03	- වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය	28-36
පරිච්ඡේදය 04	- කාර්යසාධන දර්ශක	37-40
පරිච්ඡේදය 05	- තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය	41-55
පරිච්ඡේදය 06	- මානව සම්පත් පැතිකඩ	56
පරිච්ඡේදය 07	- අනුකූලතා වාර්තාව	57-66

01 පරිච්ඡේදය
ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ඉන්දියන් සාගරයේ මුහුදු මාර්ගයට මැදිව පිහිටා ඇති ශ්‍රී ලංකාව අතීතයේ සිටම නාවිකයින්ගේ නිබඳ අවධානයට යොමු වූ දිවයිනක් විය. ඒ අනුව පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි ජාතිකයින් විසින් කාලයෙන් කාලයට අප දිවයින ඔවුන්ගේ පාලනයට නතු කරගන්නා ලදි. සියවසකට අධික කාලයක් ශ්‍රී ලංකාව පාලනය කළ ඉංග්‍රීසි ජාතිකයින් විසින් නාවික හමුදාවක අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා 1937 වර්ෂයේ දී ලංකා නාවික ස්වේච්ඡා බලකාය (Ceylon Naval Volunteer Force) ආරම්භ කරන ලදි. දෙවන ලෝක යුද්ධය අවසානයත් සමඟම රාජකීය නාවික හමුදාව විසින් ලංකා නාවික ස්වේච්ඡා බලකාය බ්‍රිතාන්‍ය නාවික හමුදාව යටතට පවරාගන්නා ලද අතර, එතැන් පටන් එය ලංකා රාජකීය නාවික ස්වේච්ඡා උපසේවය (Ceylon Royal Naval Volunteer Reserve) ලෙස හඳුන්වා දෙන ලදි. 1948 පෙබරවාරි 04 වන දින බ්‍රිතාන්‍ය යටත් විජිතයෙන් නිදහස ලබා ගැනීමත් සමඟින් ශ්‍රී ලංකාවට ස්ථිර නාවික හමුදාවක් පිහිටුවීමේ අවශ්‍යතාවය ඉස්මතු විය. ඒ අනුව 1950 දෙසැම්බර් 09 වන දින අංක 34 දරන නාවික පනත නීතිගත කළ අතර, එමඟින් ලංකා රාජකීය නාවික හමුදාව (Ceylon Royal Navy) පිහිටුවන ලදී. 1972 වර්ෂයේදී හඳුන්වා දුන් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවත් සමඟම ලංකා රාජකීය නාවික හමුදාව (Ceylon Royal Navy) යන නම ඉවත් කර, ඒ වෙනුවට ශ්‍රී ලංකා නාවික හමුදාව (Sri Lanka Navy) ලෙස නාමය වෙනස් කරන ලදි. මෙවන් ඉතිහාසයකට හිමිකම් ලබන ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් රටට අයත් මුහුදු සීමාව තුළ හා ඊට ඔබ්බෙන් වූ මුහුදේ පවා රටේ ස්වෛරීභාවය සහ භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය මෙහෙයුම් සිදු කරමින්, වෙරළ තීරය හා රට අභ්‍යන්තරයේ නීතිය හා සාමය ආරක්ෂා කරමින් රට සෞභාග්‍යමත් කිරීමට සිදු කරන කාර්යන් සඳහා තම උපරිම දායකත්වය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත ලබා දෙනු ලබයි.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු

ශ්‍රී ලංකා නාවික හමුදාව රටේ ජාතික අවශ්‍යතා ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව අවට මුහුදු තීරයේ මෙන්ම ගොඩබිමේ දී ක්‍රියාත්මක වේ. මෙහෙයුම් අවශ්‍යතා, වෙනත් හදිසි අවස්ථාවල දී නීතිය හා සාමය පවත්වා ගැනීම සඳහා ශ්‍රී ලංකාවේ අනෙකුත් හමුදාවන්ට සහ පොලිසියට සහාය ලබා දී මෑත අතීතයේ දී නාවික හමුදාවට ගොඩබිම්වල මෙහෙයුම් හැකියාව ද විශාල ලෙස වැඩිදියුණු විය.

1.2.1 දැක්ම

ශ්‍රී ලංකාවට අයත් සාගරික සම්පත් ආරක්ෂා කරමින් එහි ජාතික ආරක්ෂාව තහවුරු කරනු වස් නොගැඹුරු සහ ගැඹුරු දියඹෙහිද අභියෝගයන්ට මුහුණ දිය හැකි ශක්තිමත් නාවික හමුදාවක් ලෙස වර්ධනය වීම.

1.2.2 මෙහෙවර

ශ්‍රී ලංකාවේ ජාතික ආරක්ෂාව තහවුරු කිරීම පිණිස අවශ්‍ය අවි, උපකරණ සහිතව නිසි පුහුණුව ලබමින්, සාගරික සම්පත් ආරක්ෂා කරමින් මහ මුහුදේ ආධිපත්‍යය රැකගත හැකි නාවික හමුදාවක් බවට පත් වීම.

1.2.3 අරමුණු

අ. නාවික කටයුතු

(1) ශ්‍රී ලංකාවේ සමුද්‍රීය ආරක්ෂාව සුරක්ෂිත කිරීම තුළින් ස්වෛරී සහ භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කිරීම.
(2) අවි ජාවාරම සහ මත්ද්‍රව්‍ය ජාවාරම වැළැක්වීම.
(3) නීති විරෝධී සංක්‍රමණිකයින් වැළැක්වීම/ රට තුළට සංක්‍රමණය වීම වැළැක්වීම.
(4) නීති විරෝධී ජාවාරම් වැළැක්වීම.
(5) ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් සඳහා ශ්‍රී ලංකාවේ මුහුදු තීරය භාවිත කිරීම වැළැක්වීම.
(6) ශ්‍රී ලංකා මුහුදේ අනවසර මසුන් ඇල්ලීම වැළැක්වීම.

(7) මසුන් ඇල්ලීම සහ අනවසර මූලද්‍රව්‍ය මඟින් සමුද්‍ර සම්පත් ගවේෂණය කිරීම හා සූරාකෑම වැළැක්වීම සඳහා අධීක්ෂණය.
(8) ත්‍රස්තවාදී ප්‍රහාර, කඩාකප්පල්කාරී ප්‍රහාර, මුහුදු කොල්ලකෑම්වලට එරෙහිව සියලු වරායන් සඳහා ආරක්ෂාව සැපයීම.
(9) යුධමය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙහෙයුම් සිදු කිරීම සහ ස්වකීය හමුදාවන්ට ආධාර කිරීම සඳහා නාවික සහාය ලබා දීම.
(10) මුහුදු සන්නිවේදන මාර්ග පවත්වා ගෙන යන අතර, අවශ්‍ය විටෙක ආරක්ෂක අංශ සඳහා සැපයුම් සහය සහ මුහුදු ගමන් සැපයීම.
(11) මුහුදේ නිරීක්ෂණ කටයුතු සහ මුදාගැනීමේ මෙහෙයුම් සිදු කිරීම.
(12) කිමිදුම් සහ ගැලවීමේ මෙහෙයුම් සිදු කිරීම.
(13) නැව් නඩත්තු කිරීම, අලුත්වැඩියා කිරීම සහ ඉදිකිරීම.
(14) භූමි මෙහෙයුම් සහ භූමි ආරක්ෂාව.
(15) නාවික හටයින් පුහුණු කිරීම.

ආ. <u>නාවික නොවන ක්‍රියාකාරකම්</u>

(1) සිවිල් බලයට ආධාර කිරීම සහ ස්වාභාවික විපත්වලදී ආධාර සැපයීම.
(2) සමුද්‍රීය කුසලතා රජයට සහ වෙනත් සංවිධානවලට ලබා දීම.
(3) නාවික නොවන පුද්ගලයින් පුහුණු කිරීම.
(4) සම්භාවනීය අමුත්තන්ට සහ අනෙකුත් පුද්ගලයින්ට මුහුදු ගමන් පහසුකම් සැපයීම.
(5) රජයේ සහ පෞද්ගලික සංවිධානවලට කිමිදුම් සහ ගැලවීමේ ආධාර ලබා දීම.
(6) ශ්‍රී ලංකා රේගුවට සහාය වීම.
(7) විද්‍යාත්මක හා සාගර දත්ත රැස් කිරීම.


1.3 <u>ප්‍රධාන කාර්යයන්</u>

අ. ආරක්ෂක සේනාවන්හී එක් විශේෂ යුධ සේනාංකයක් ලෙස ශ්‍රී ලංකා නාවික හමුදාව නම් කළ හැක. මෙහි ප්‍රාථමික කාර්යභාරය වනුයේ විශේෂයෙන්ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රතිපත්තීන්ට අනුව රටට අයත් මුහුදු සීමාව තුළ හා ඊට ඔබ්බෙන් රටේ ස්වෛරීභාවය සහ භෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කිරීම සඳහා ඊට එරෙහිව හට ගන්නා මොනයම් හෝ තර්ජනයන්ගෙන් රට ආරක්ෂා කිරීමත් ගැඹුරු මුහුදේ, වෙරළ තීරය හා රට අභ්‍යන්තරයේදී නීතිය හා සාමය ආරක්ෂා කරමින් රට සෞභාග්‍යමත් කිරීමට සිදු කරන කාර්යන් සඳහා දායක වීමත්ය. නාවික හමුදාව මඟින් ආරක්ෂා කරන කලාපයන් වශයෙන් මුහුදුකරය, දේශීය ජලතීරය, යාබද කලාප සහ විශේෂිත ආර්ථික කලාපයන් නම් කර ඇති අතර, ඒ ඒ කලාපයන්ට අදාළව පවරා ඇති රාජකාරීන් සාමකාමී හා ගැටුම්කාරී වාතාවරණයන් තුළ එක ලෙස ඉටු කිරීමට නාවික හමුදාව බැඳී සිටියි.

ආ. තවද, විශේෂයෙන් ඇතිවිය හැකි අභ්‍යන්තර ගැටුම් වැනි ගැටලුකාරී අවස්ථාවන්හිදී අනෙකුත් ආරක්ෂක සේවා සමඟ එක්වී ගොඩබිම් මෙහෙයුම් දියත්කර රටේ නීතිය හා සාමය ආරක්ෂා කිරීමේ කර්තව්‍යන්හී නිරත වීම ද්විතියික කාර්යය ලෙස හැඳින් වේ.

ඇ. තවද, රාජ්‍ය ආයතනයන්හී පරිපාලන කටයුතු සඳහා සහාය වීම, විශේෂයෙන්ම සංවර්ධන වැඩපිළිවෙල උදෙසා සමුද්‍රීය ක්‍රියාකාරකම්වල යෙදී සිටින ආයතන සඳහා සහයෝගය ලබා දීම හා වෙරළ හා සමුද්‍රීය ආරක්ෂණය නාවික හමුදාවේ තෘතීය කාර්යය ලෙස හැඳින්විය හැක.

නාවික හමුදා සංවිධාන සටහන



1.5 රටට අයත් මුහුදු තීරය ඵලදායි ලෙස පරිපාලනය සහ ආරක්ෂා කිරීමත්, පැවරෙන රාජකාරීන් කාර්යක්ෂමව ඉටුකිරීමත් සඳහා සමස්ථ දිවයිනම ආවරණය වන අයුරින් පහත සඳහන් පරිදි නාවික විධාන 07කට බෙදා වෙන් කර පරිපාලන කටයුතු සිදු කරනු ලබයි.

අ.	බටහිර නාවික විධානය	-	ආඥාපති බටහිර නාවික පෙදෙස විසින් අණදෙනු ලබයි
ආ.	නැගෙනහිර නාවික විධානය	-	ආඥාපති නැගෙනහිර නාවික පෙදෙස විසින් අණදෙනු ලබයි
ඇ.	උතුරු නාවික විධානය	-	ආඥාපති උතුරු නාවික පෙදෙස විසින් අණදෙනු ලබයි
ඈ.	උතුරු මැද නාවික විධානය	-	ආඥාපති උතුරු මැද නාවික පෙදෙස විසින් අණදෙනු ලබයි
ඉ.	දකුණු නාවික විධානය	-	ආඥාපති දකුණු නාවික පෙදෙස විසින් අණදෙනු ලබයි
ඊ.	වයඹ නාවික විධානය	-	ආඥාපති වයඹ නාවික පෙදෙස විසින් අණදෙනු ලබයි
උ.	ගිණිකොණ නාවික විධානය	-	ආඥාපති ගිණිකොණ නාවික පෙදෙස විසින් අණදෙනු ලබයි

1.6 ශ්‍රී ලංකා නාවික හමුදාවේ ඇති ඒ ඒ නාවික විධානයන්ට අයත් ගොඩබිම් ආයතන පහත පරිදි වේ.

අ.	බටහිර නාවික විධානය	ශ්‍රීලංනානෞ ලංකා ශ්‍රීලංනානෞ ගැමුණු ශ්‍රීලංනානෞ මහසෙන් ශ්‍රීලංනානෞ රංගල ශ්‍රීලංනානෞ පරාක්‍රම නාවික මහ රෝහල (කොළඹ) ශ්‍රීලංනානෞ ශිල්ප ශ්‍රීලංනානෞ කැළණි ශ්‍රීලංනානෞ තක්ෂිලා නාවික ස්ථානගත කිරීම අකුරේගොඩ
ආ.	නැගෙනහිර නාවික විධානය	නාවික හා සාගරික විද්‍යාපීඨය ශ්‍රීලංනානෞ විදුර 4 වන වේග ප්‍රහාරක යාත්‍රා සමූහය ශ්‍රීලංනා තටාකංගණය ශ්‍රීලංනානෞ විජයබා ශ්‍රීලංනානෞ කාශ්‍යප ශ්‍රීලංනානෞ රන්වැලි ශ්‍රීලංනානෞ තිස්ස ශ්‍රීලංනානෞ මහවැලි ශ්‍රීලංනානෞ පැරකුම්බා ශ්‍රීලංනානෞ ගෝඨාභය විශේෂ යාත්‍රා බලඝණ මූලස්ථානය ශ්‍රීලංනානෞ ගෝකණ්ණ ශ්‍රීලංනානෞ වළගම්බා ශ්‍රීලංනානෞ ලංකාපටුන

ඇ. උතුරු නාවික විධානය

ශ්‍රීලංනානෞ වේළුසුමන
ශ්‍රීලංනානෞ කංචදේව
ශ්‍රීලංනානෞ උත්තර
ශ්‍රීලංනානෞ එළාර
ශ්‍රීලංනානෞ අග්බෝ
ශ්‍රීලංනානෞ වසභ
ශ්‍රීලංනානෞ ගෝඨයිම්බර
නාවික ස්ථානගත කිරීම වෙත්තලකේණි

ඈ. උතුරු මැද නාවික විධානය

ශ්‍රීලංනානෞ ශික්ෂා
ශ්‍රීලංනානෞ පණ්ඩුකාභය
ශ්‍රීලංනානෞ තම්මැන්නා
ශ්‍රීලංනානෞ ගජබා
ශ්‍රීලංනානෞ ඵුස්සදේව
ශ්‍රීලංනානෞ බුවනෙක

ඉ. දකුණු නාවික විධානය

ශ්‍රීලංනානෞ දක්ෂිණ
ශ්‍රීලංනානෞ නිපුණ
ශ්‍රීලංනානෞ කාවන්තිස්ස
ශ්‍රීලංනානෞ රුහුණ

ඊ. වයඹ නාවික විධානය

ශ්‍රීලංනානෞ විජය
ශ්‍රීලංනානෞ තම්බපණ්නි
ශ්‍රීලංනානෞ භරණ
ක්ෂණික ක්‍රියාකාරී යාත්‍රා බලඝණ මූලස්ථානය
ශ්‍රීලංනානෞ ථේරපුත්ත
නාවික ස්ථානගත කිරීම මහව

උ. ගිණිකොන නාවික විධානය

ශ්‍රීලංනානෞ මහානාග
ශ්‍රීලංනානෞ දිසායු

ඌ. ශ්‍රී ලංකා නාවික හමුදාව තුළ ඇති නෞකා සහ යාත්‍රාවන්

(1)	ගැඹුරු මුහුදු නිරීක්ෂණ නෞකා	-	08
(2)	වේග මිසයිල ප්‍රහාරක නෞකා	-	02
(3)	වේග ප්‍රහාරක නෞකා	-	09
(4)	වෙරළාරක්ෂක මුර නෞකා	-	02
(5)	වේග ප්‍රහාරක මුර යාත්‍රා	-	48
(6)	වේග මගී ප්‍රවාහන යාත්‍රා	-	03
(7)	ගොඩ බිමට යාහැකි භාණ්ඩ ප්‍රවාහන නෞකා	-	01
(8)	ගොඩ බිමට යාහැකි මධ්‍යම ප්‍රමාණයේ යාත්‍රා	-	02
(9)	ගොඩ බිමට යාමට උපයෝගි කර ගන්නා යාත්‍රා	-	03
(10)	වේගයෙන් ගොඩ බිමට යාහැකි යාත්‍රා	-	02
(11)	සහායක යත්‍රා	-	01
(12)	වෙරළ ආරක්ෂක මුර යාත්‍රා	-	06
(13)	වෙරළ ආරක්ෂක මුර යාත්‍රා (වෙරළ ආරක්ෂක)	-	70
(14)	වෙරළාසන්න මුර යාත්‍රා	-	34
(15)	කළපු ආශ්‍රිත යාත්‍රා	-	20
(16)	ටග් යාත්‍රා	-	04
(17)	ඇරෝ යාත්‍රා	-	161
(18)	ට්‍රොලර් සහ වල්ලම්	-	29
(19)	ලයින් බෝට්	-	01
(20)	ඩිංගි යාත්‍රා	-	320

1.7 විදේශ අරමුදල් සහිත ව්‍යාපෘති පිළිබඳ විස්තර

අ. ඉන්දියානු රජය මගින් ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත පාවෙන තටාකංගණයක් ප්‍රදානයක් වශයෙන් ලබා දීම සඳහා අවශ්‍ය ගිවිසුම් අත්සන් කර ඇත. මේ වන විට Goa Shipyard Ltd ආයතනය එය නිපදවීමේ කටයුතු ආරම්භ කර ඇති අතර, එම පාවෙන තටාකංගණය 2025 වසර තුළ දී ශ්‍රී ලංකාව වෙත ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති.

ආ. ඇමෙරිකානු වෙරළාරක්ෂ දෙපාර්තමේන්තුවට අයත් අඩි 210ක් දිග (Ex USCG DESICIVE) නෞකාව ඇමරිකානු රජයේ ආධාරයක් වශයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ලබා ගැනීමට කටයුතු ආරම්භ කර ඇති අතර අත්පත් කර ගැනීමේ වියදම වශයෙන් ඇ.ඩො.මි. 10ක් ඇස්තමේන්තු කර ඇති අතර ශ්‍රී ලංකා රජයට ඉන් ඇ.ඩො.මි. 01ක වියදමක් දැරීමට සිදු වේ. මෙම නෞකාව 2025 පෙබරවාරි මාසයේ දී ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ලබා ගැනීමට සැලසුම් කර ඇත.

02 පරිච්ඡේදය
ප්‍රගතිය හා ඉදිරි දැක්ම


2.1 2023 වර්ෂයට ආදාළ ප්‍රගතිය

2.1.1 ජාතික ආරක්ෂාව තහවුරු කිරීම සඳහා වන උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම

අ. නාවික හමුදා ප්‍රතිපත්තිවලට අනුව ජාතික ආරක්ෂාවට තර්ජනයක් වන ක්‍රියා, නීති විරෝධී අවි ජාවාරම්, නීති විරෝධී මත්ද්‍රව්‍ය ජාවාරම්, නීති විරෝධී සංක්‍රමණිකයින් රට තුළට ඇතුළුවීම්, රේගු නීති උල්ලංඝනය කිරීම්, නීති විරෝධී මසුන් මැරීම හා සාගරය දූෂණය කිරීම් වැනි ක්‍රියාකාරකම් මැඩලීම සඳහා දේශීය සහ විදේශීය බුද්ධි අංශ සමඟ සම්බන්ධීකරණය වී කටයුතු කරන ලදි.

ආ. නාවික හමුදා බුද්ධි අංශයේ ක්‍රියාකාරීත්වය ශක්තිමත් කිරීම සඳහා බුද්ධි අංශය වෙත නිලධාරීන් 08ක් සහ නාවිකයින් 16ක ප්‍රමාණයක් අලුතින් බඳවාගෙන ඇති අතර, නීති විරෝධී කටයුතු වැළැක්වීම සම්බන්ධව තොරතුරු ලබා ගැනීම සහ අත්අඩංගුවට ගැනීම වෙනුවෙන් වූ මෙහෙයුම් සඳහා මේ වන විට බුද්ධි අංශ නිලධාරීන් 61ක් සහ නාවිකයින් 567ක ප්‍රමාණයක් යොදවා ඇත.

2.1.2 නාවික හමුදා පුද්ගලයින්හට වැටුප් හා දීමනා ගෙවීම



මූලික වැටුප නිත්‍ය	රු.15,506,313,905.58
මූලික වැටුප ස්වේච්ඡා	රු. 4,750,180,113.88
අනෙකුත් දීමනා නිත්‍ය	රු.15,712,911,711.95
අනෙකුත් දීමනා ස්වේච්ඡා	රු. 5,191,525,402.02
එකතුව	රු.41,160,931,133.43

2.1.3 නාවික හමුදා පුද්ගලයින්හට උසස්වීම් ලබා දීම

අ. නිලධාරීන්

අනු අංකය	උසස් කරන ලද නිලය	උසස් කරන ලද ගණන
1.	රියර් අද්මිරාල්	15
2.	කොමදෝරු	24
3.	කපිතාන්	40
4.	කොමාණ්ඩර්	115
5.	ලුතිනන් කොමාණ්ඩර්	131
6.	ලුතිනන්	116
7.	උප ලුතිනන්	86
8.	වැඩ බලන උප ලුතිනන්	48
9.	මධ්‍ය නිලධාරී	39
එකතුව		614

ආ. නාවිකයින්

අනු අංකය	උසස් කරන ලද තරාතිරම	උසස් කරන ලද ගණන
1.	පාලක ප්‍රධාන සුළු නිලධාරි	383
2.	සමූහ ප්‍රධාන සුළු නිලධාරි	700
3.	ප්‍රධාන සුළු නිලධාරි	1500
4.	සුළු නිලධාරි	235
5.	නායක නැවි	2720
6.	බල නැවි	1011
7.	සාමාන්‍ය නැවි	1739
එකතුව		8288

2.1.4 <u>නාවික හමුදා පුද්ගලයින්හට පදක්කම් පිරිනැමීම</u>

අනු අංකය	පදක්කම	නාවික පුද්ගලයින් ගණන
1.	විශිෂ්ඨ සේවා විභූෂණය	17
2.	උත්තම සේවා පදක්කම	372
3.	විදේශ සේවා පදක්කම	4
4.	ශ්‍රී ලංකා සන්නද්ධ සේවා දීර්ඝ සේවා පදක්කම සහ සන්දාරය	4233
5.	75 වන නිදහස් සංවත්සර සමරු පදක්කම	46182
6.	ප්‍රශංසනීය සේවා විභූෂණය සහ ප්‍රශංසනීය සේවා පදක්කම	100
7.	එක්සත් ජාතීන්ගේ සාම සාධක පදක්කම	3
8.	නාවික හමුදාධිපතිගේ ප්‍රශංසාත්මක පළඳනාව	299
9.	ජාතික ආරක්ෂක විද්‍යාලයීය පාඨමාලාව සඳහා වූ පළඳනාව	26
10.	මුහුදු සංග්‍රාමික පළඳනාව	775
11.	මුහුදු විධාන පළඳනාව	25
12.	4 වන වේග ප්‍රහාරක මුර යාත්‍රා පළඳනාව	151
13.	ගුවන් නිරීක්ෂණ පාඨමාලාව සඳහා වූ පළඳනාව	5
14.	පූර්ණ කාලීන පාඨමාලාවන් සඳහා වූ පළඳනාව	31

2.1.5 <u>නාවික හමුදා පුද්ගලයින් හට පුහුණු හා පාඨමාලා ලබා දීම</u>

පාඨමාලා වර්ගය	පුහුණුව ලැබූ ප්‍රමාණය	
	නිලධාරීන්	නාවිකයින්
අභ්‍යන්තර	447	7854
බාහිර	821	1829
විදේශීය	325	122
විභාග	6899	77632

2.1.6 <u>නාවික හමුදා පුද්ගලයින්ගේ සුභසාධනයට අදාළ කටයුතු ඉටු කිරීම</u>

අ. ඉදුරාම ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් මියගිය සහ අතුරුදහන් වූ නාවික පුද්ගලයින්ගේ ළඟම ඥාතීන් සහ ආබාධිතව විශ්‍රාම ගන්වන ලද නාවික පුද්ගලයින් සහ ඔවුන්ගේ පවුල් සඳහා වාර්ෂිකව සිදු කරනු ලබන සුවදුක් විමසීමේ වැඩසටහන 2023 වර්ෂය සඳහා දෙසැම්බර් මාසය තුළ ක්‍රියාත්මක කරන ලදී.

ආ. ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී මියගිය/ අතුරුදහන් වූ නාවික පුද්ගලයින්ගේ ළඟම ඥාතීන් සහ ආබාධිත විශ්‍රාමික නාවික පුද්ගලයින් වෙත ඔවුන්ගේ හදිසි ප්‍රතිකාර සඳහා සහ සුභසාධන කටයුතු වෙනුවෙන් ප්‍රතිලාභීන් 46ක් සඳහා රු. 6,201,324.10ක මූල්‍යාධාර ලබා දීමට කටයුතු කර ඇත.

ඇ. ශ්‍රී ලංකා නාවික හමුදා සේවයෙන් විශ්‍රාම ගොස් සිටියදී මිය ගිය නාවික පුද්ගලයින්ගේ අවමංගල්‍යකදී අවමංගල්‍යාධාර මුදලක් වශයෙන් ළඟම ඥාතීන් හට රු. 100,000.00ක මුදලක් ලබා දෙනු ලබන අතර, 2023 වර්ෂය සඳහා මියගිය විශ්‍රාමික නාවික පුද්ගලයින් 51 දෙනෙකුගේ ළඟම ඥාතීන් හට රු. 5,100,000.00ක මුදලක් අවමංගල්‍යාධාර ලෙස ලබා දී ඇත.

ඈ. නැවිරුසවිය (නාවික සුවසහන) අරමුදල මගින් 2023 වර්ෂය තුළ නාවික හමුදා සාමාජිකයින් සහ ඔවුන්ගේ ළඟම ඥාතීන් සඳහා බරපතල රෝගාබාධ හා සැත්කම් වෙනුවෙන් සහ මරණ වන්දි වශයෙන් රු. 270,783,788.70ක මුදලක් ලබා දී ඇත.

ඉ. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරන ක්‍රියාන්විතයේදී දිවි පිදූ, ආබාධිත වූ හා අතුරුදන් වූ නාවික පුද්ගලයින් වෙනුවෙන් 'මෙත් සෙවණ' නිවාස ව්‍යාපෘතිය සහ සේවයේ නියුතු හා විශ්‍රාමික නාවික පුද්ගලයින් වෙනුවෙන් 'අපි වෙනුවෙන් අපි' නිවාස ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර පූර්ණ නිවාස 07ක් ඉදිකරමින් පවතින අතර, අර්ධ නිවාස 23ක් ඉදිකර අවසන් කර ඇත. තවද, අර්ධ නිවාස 56ක් මේ වන විට ඉදිකරමින් පවති.

2.1.7 **<u>මුහුදු සීමා උල්ලංඝනය කරමින් නීති විරෝධී භාණ්ඩ හා සේවා ජාවාරම් වැළැක්වීම</u>**

අත්අඩංගුවට ගන්නා ලද සහ සොයා ගන්නා ලද නීති විරෝධී සංක්‍රමණිකයින්, නීති විරෝධී ධීවර කටයුතු සහ නීති විරෝධී වෙනත් ද්‍රව්‍ය පිළිබඳ විස්තර පහත පරිදි වේ.

අ. නීති විරෝධී සංක්‍රමණිකයින් හා යාත්‍රා අත්අඩංගුවට ගැනීම් පිළිබඳ විස්තර

(1)	මුහුදේ දී අත්අඩංගුවට ගත් පුද්ගලයින් ගණන	-	03
(2)	ගොඩබිමෙන් අත්අඩංගුවට ගත් පුද්ගලයින් ගණන	-	02
(3)	අත්අඩංගුවට ගත් යාත්‍රා ගණන	-	01

ආ. නීති විරෝධී ධීවර කටයුතුවල දී අත්අඩංගුවට ගැනීම්

(1)	ට්‍රෝලර් යාත්‍රා (දේශීය)	-	08
(2)	අත්අඩංගුවට ගත් පුද්ගලයින් (දේශීය)	-	1655
(3)	ට්‍රෝලර් යාත්‍රා (ඉන්දියානු)	-	37
(4)	අත්අඩංගුවට ගත් පුද්ගලයින් (ඉන්දියානු)	-	262
(5)	ඩිංගි යාත්‍රා	-	223
(6)	වල්ලම්	-	03
(7)	ඔරු	-	02
(8)	නීති විරෝධී දැල් ආම්පන්න	-	914
(9)	වෝටර් ජෙල්	-	කි.ග්‍රෑ. 57.126

ඇ. නීති විරෝධී වෙනත් ද්‍රව්‍ය අත්අඩංගුවට ගැනීම් සහ සොයා ගැනීම්

(1)	බීඩි කොළ	-	කි.ග්‍රෑ. 36910.585
(2)	දුම්වැටි	-	41380
(3)	මත්පැන්	-	බෝතල් 191
(4)	කෘමිනාශක	-	බෝතල් 4722ක් සහ පැකට් 12907
(5)	රත්‍රං	-	කි.ග්‍රෑ. 14.948
(6)	කහ	-	කි.ග්‍රෑ. 990.600
(7)	එනසාල්	-	කි.ග්‍රෑ. 1267
(8)	අත්අඩංගුවට ගත් පුද්ගලයින්	-	92

2.1.8 **<u>අන්තර්ජාතික ආරක්ෂක සහයෝගීතාව හා සාම සාධක රාජකාරී</u>**

2023 වර්ෂය තුළ නිලධාරීන් දෙදෙනෙකු සහ එක් නිලධාරිනියක් එක්සත් ජාතික සාමසාධක රාජකාරි සඳහා විදෙස්ගත කිරීමට කටයුතු කර ඇත.

2.1.9 **<u>මත්ද්‍රව්‍ය උවදුරෙන් නිදහස් රටක් ඇති කිරීම සඳහා වන උපායමාර්ග</u>**

අ. නාවික හමුදා බුද්ධි අංශ සාමාජිකයින් විසින් සපයනු ලැබූ තොරතුරුවලට අනුව 2023 වර්ෂය තුළ අත්අඩංගුවට ගන්නා ලද/ සොයා ගන්නා ලද නීති විරෝධී මත්ද්‍රව්‍ය සහ ඒ සම්බන්ධව අත්අඩංගුවට ගත් පුද්ගලයින් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

(1)	හෙරොයින්	-	කි.ග්‍රෑ. 715.516167
(2)	ක්‍රිස්ටල් මෙතපිටමයින් (අයිස්)	-	කි.ග්‍රෑ. 11.077879
(3)	කේරළ ගංජා	-	කි.ග්‍රෑ. 3711.867
(4)	දේශීය ගංජා	-	කි.ග්‍රෑ. 50.539 සහ පැල 92572
(5)	හෂිස්	-	කි.ග්‍රෑ. 140.993356
(6)	මෝදක	-	2642
(7)	මත්පෙති	-	1016755
(8)	අත්අඩංගුවට ගත් පුද්ගලයින්	-	220

ආ. 2023 වර්ෂය තුළ නාවික හමුදා පුද්ගලයින් 11207ක් සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් 332ක් පවත්වා ඇත.

2.1.10 **<u>ග්‍රාමීය ප්‍රජා ආරක්ෂාව, සුභසාධනය, ජීවනෝපාය දායකත්වය, රැකියා උත්පාදනය සහ ආපදා කළමනාකරණයට සහය දැක්වීම</u>**.

අ. 2023 වර්ෂය තුළ දී ශ්‍රී ලංකා වෙරළ තීරයන් අවස්ථා 846 දී නාවික පුද්ගලයින් 19176 සහභාගිත්වයෙන් පිරිසිදු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව ප්ලාස්ටික් සහ අපද්‍රව්‍ය කි.ග්‍රෑ 6524 ප්‍රමාණයක් එකතු කර ප්‍රතිචක්‍රීකරණ කටයුතු සඳහා ලබා දී ඇත.

ආ. ජාත්‍යන්තර කඩොලාන දිනය සහ පරිසර දිනයට සමගාමීව වැඩසටහන් ක්‍රියාත්මක කර කඩොලාන පැල 6608ක් හා වෙනත් පැල වර්ග 578ක් සිටුවන ලද අතර, වයඹ නාවික විධානයට අයත් කරුකපන අණුකණ්ඩයේ අලුතින් කඩොලාන පැල තවානක් ආරම්භ කර DFCC බැංකුව හා එක්ව කඩොලාන පැළ 1200ක් සිටුවීමේ මූලික ව්‍යාපෘතියක් ආරම්භ කරන ලදි.

ඇ. 2023 සැප්තැම්බර් මස 01 වන දින සහ දෙසැම්බර් මස 04 වන යන දිනයන් හි සිට ආරම්භ වන පරිදි දින 07ක ආපදා කළමනාකරණ පුහුණු පාඨමාලාවන් සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ භටයින් හට (එක් අවස්ථාවකදී 20 බැගින් භටයින් 40 දෙනෙකු සඳහා) ලබා දී ඇත.

ඈ. 2023 දෙසැම්බර් මස 16 වන දින එළුවන්කුලම පාසලේ තරුණ ප්‍රජාව සඳහා නායකත්ව වැඩමුළුවක් පවත්වන ලදි.

ඉ. ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල දියේ ගිලී ජීවිතක්ෂයටපත් මළ සිරුරු සෙවීම් අවස්ථා 94ක් සඳහා දායකත්වය ලබා දී ඇති අතර, ඉන් මෘත ශරීර 14ක් සොයා ගැනීමට හැකිවී ඇත. තවද, ජාත්‍යන්තරයේ විශේෂ අවධානයට ලක් වූ "LU PENG YUAN YU" යන චීන ධීවර යාත්‍රාව ගැඹුරු මුහුදේ අනතුරට ලක් වූ අවස්ථාවේ එහි සිරවී තිබූ මෘත ශරීර 12ක් හඳුනා ගැනීමට හැකි විය.

ඊ. සොරව් අලුත්වැඩියා කිරීම්, ඉදිකිරීම් සහ සංවර්ධන කටයුතු, ජීවිතාරක්ෂක රාජකාරි, අපරාධ පරීක්ෂණ රාජකාරි සහ සම්පීඩන කුයීර ප්‍රතිකාර ලබා දීම ආදි විශේෂ කිමිදුම් රාජකාරි අවස්ථාවන් 60ක් සඳහා දායකත්වය ලබා දී ඇත.

උ. 2023 වර්ෂය තුළ දිවයිනේ ඇති වූ හදිසි ගංවතුර තත්වයන්හි දී පුද්ගලයින් 12249ක් ඉන් මුදවාගෙන ආරක්ෂිත ස්ථානයන් වෙත ප්‍රවාහනය කිරීමට සහ විපතටපත් එම පුද්ගලයින් හට වතුර බෝතල් 1195ක් සහ ආහාර පාර්සල් 25567ක් ලබා දීමට කටයුතු සිදු කර ඇත.

ඌ. ජීවිතාරක්ෂක රාජකාරි සඳහා ජීවිතාරක්ෂක උපකරණ සහිතව අවස්ථාවන් 10ක දී නාවික පුද්ගලයින් 108ක් සහ යාත්‍රාවන් 18ක් යෙදවීමට කටයුතු සිදු කරන ලදි.

එ. ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් 2023 වසර තුළ ගැඹුරු මුහුදේ දී ආපදාවට ලක්වූ නෞකා සහ යාත්‍රාවන් 26ක් (දේශීය - 20 සහ විදේශීය - 06) සඳහා සහය ලබා දී ඇත. එමෙන්ම පුද්ගල ජීවිත 36ක් (දේශීය - 32 සහ විදේශීය - 04) ආරක්ෂිතව බේරා ගැනීමට සමත්ව ඇත.

2.1.11 <u>නාවික හමුදාව මඟින් බාහිර ආයතන සඳහා සිදු කරන ලද ව්‍යාපෘතීන්</u>

අනු අංකය	විස්තරය	ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු ගත මුළු මුදල (රු. මිලි)	2023 වර්ෂය තුළ නිම කරන ලද ව්‍යාපෘති ගණන	2023 වර්ෂය තුළ නිම නොවූ ව්‍යාපෘති ගණන	2023 වර්ෂය තුළ සිදු කරන ලද මුළු ව්‍යාපෘති ගණන
1	ආගමික ස්ථාන	2,428.33	40	74	114
2	ආගමික නොවන ස්ථාන	10,407.19	59	50	109

2.1.12 <u>නාවික පර්යේෂණ හා සංවර්ධන ඒකකය (ප්‍රති ආශ්‍රැතිකරණ යන්තු) විසින් සිදු කරන ලද ව්‍යාපෘති පිළිබඳ විස්තර</u>

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර සිදු කරන ලද ව්‍යාපෘති		විවිධ පරිත්‍යාගශීලීන් විසින් ඉදිරිපත් කර සිදු කරන ලද ව්‍යාපෘති		එකතුව	
වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති	වැඩ සිදු කරමින් පවතින ව්‍යාපෘති	වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති	වැඩ සිදු කරමින් පවතින ව්‍යාපෘති	වැඩ අවසන් කරන ලද ව්‍යාපෘති	වැඩ සිදු කරමින් පවතින ව්‍යාපෘති
5	1	34	7	39	8

2.1.13 <u>නාවික පුද්ගලයින් සහ සිවිල් ජනතාවගේ සෞඛ්‍ය තත්වය නගා සිටුවීම සඳහා සහය දැක්වීම</u>

අ. රජයේ රෝහල්වල සිදු වූ වැඩවර්ජන අවස්ථාවන්හි දී රෝහල් කටයුතු අඛණ්ඩව සිදු කර ගෙන යාම සඳහා නාවික හමුදා වෛද්‍ය කාර්ය මණ්ඩලයේ සහයෝගය ලබා දීම.

ආ. දිවයින තුළ උද්ගත වූ ස්භාවික ව්‍යසන අවස්ථාවන්හි දී සිවිල් ප්‍රජාව වෙත වෛද්‍ය පහසුකම් සැපයීම.

ඇ. සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් සංවිධානය කරන ඩෙංගු මර්ධන වැඩසටහන්, විවිධ නිවාරණ වැඩසටහන් සහ පාගමන් සඳහා නාවික හමුදාවේ සහභාගීත්වය ලබා දීම.

ඈ. රජයේ රෝහල් හා සම්බන්ධීකරණය වී සියලුම නාවික විධානයන් ආවරණය වන පරිදි ලේ දන්දීමේ වැඩසටහන් පැවැත්වීම.

ඉ. නාවික පුද්ගලයින්, නාවික පුද්ගලයින්ගේ පවුල්වල සාමාජිකයින්, නාවික හමුදා සිවිල් සේවකයින්, විශ්‍රාමික නාවික හමුදා පුද්ගලයින්, ආබාධිත නාවික පුද්ගලයින්, ආරක්ෂක අමාත්‍යාංශය කාර්ය මණ්ඩලය සහ ජනාධිපති ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර නාවික රෝහල් මඟින් ලබා දීම.

2.1.14 <u>නාවික හමුදාව ලද සුවිශේෂී ජයග්‍රහණ</u>

අ. පරිසර අමාත්‍යාංශය සහ මධ්‍යම පරිසර අධිකාරිය මගින් සංවිධානය කර 2023 අප්‍රේල් 28 වැනි දින පවත්වන ලද 2021-2022 වර්ෂ සඳහා වූ ජනාධිපති පරිසර සම්මාන උළෙළ දී පරිසර සංරක්ෂණය සඳහා වූ විශිෂ්ඨ දායකත්වය වෙනුවෙන් ත්‍රිකුණාමලය නාවික තටාකංගණයට පරිසර අංශයට දායක වන හොඳම රාජ්‍ය ආයතනයට හිමි රන් කුසලානය පිරිනමන ලදී.

ආ. www.navy.lk වෙබ් අඩවිය 2023 වර්ෂයේ රාජ්‍ය අංශයේ හොඳම වෙබ් අඩවියට හිමි රන් සම්මානය සහ ශ්‍රී ලංකාවේ සියලු වෙබ් අඩවි අතුරින් තෙවන ස්ථානයට හිමි ලෝකඩ පදක්කම ලබා ගැනීමට හැකි වී ඇත.

ඇ. ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් "Emerging New Order in the Indian Ocean" යන තේමාව යටතේ සංවිධානය කළ එකොළොස්වන (11) ගාලු කථිකාව අන්තර්ජාතික සමුද්‍රීය සම්මන්ත්‍රණය රටවල් 42ක හා ජාත්‍යන්තර සංවිධාන 11ක සමුද්‍රීය ආරක්ෂක විද්වතුන්, රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන් සහ නියෝජිතයින්ගේ සහභාගීත්වයෙන් 2023 ඔක්තෝබර් මස 12 සහ 13 යන දිනයන්හි දී ගාල්ලේ දී පැවැත්වීම.

ඈ. ශ්‍රී ලංකා නාවික හමුදා පුද්ගලයින් විසින් 2023 වර්ෂය තුළ පහත සඳහන් ප්‍රධාන ක්‍රීඩා ජයග්‍රහණ ලබා ගැනීමට කටයුතු කර ඇත.

ක්‍රීඩා තරගාවලිය සම්බන්ධ විස්තර	**රන් පදක්කම්**	**රිදී පදක්කම්**	**ලෝකඩ පදක්කම්**
59 වන ජාතික ජූඩෝ ශූරතාවලිය 2023	04	01	05
ජාතික මල්ලව පොර ශූරතාවලිය - 2023	07	03	03
ජාතික වෙඩි තැබීමේ ශූරතාවලිය (NSSF 22 (25m/ 50m) National Championship)	05	02	03
ඩුබායි හි පැවති පැරා මළල ක්‍රීඩා තරාගාවලිය (Dubai GRAND RRIX 2023 14 FAZZA International Para athletic Championship – 2023)	බල නැවි එස්එම්ඒඑස්එම් සුභසිංහ, එක්ස්එස් 83900 විසින් එහි ප්‍රථම ස්ථානය දිනා ගැනීම		
76 වන ජාතික මේස පන්දු ශූරතාවලිය	කාන්තා විවෘත අංශය සඳහා සානැවි එච්පී කපුගීකියන, ඩබ්වීඑස් 78471 ශූරතාවය දිනා ඇත.		

ඉ. ඉන්දියානු සාගර නාවික සම්මන්ත්‍රණයේ අන්තර් ජාතික රචනා තරඟාවලිය 2022 සඳහා කොමාණ්ඩර් ඒපීඒ ප්‍රසංග, එන්ආර්එක්ස් 1849 යන නිලධාරියා විසින් " Fishing for the future: Strategies and collaborations for the Preservation of Indian Ocean fisheries" මාතෘකාව යටතේ ඉදිරිපත් කරන ලද රචනය සඳහා ප්‍රථම ස්ථානය ලබා ගැනීමට හැකි වී ඇත.

ඊ. උපාධිධාරී ඉංජිනේරු පුහුණු කිරීමේ අනුමත ආයතනයක් ලෙස කපිතාන් සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව (නැගෙනහිර) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පිළිගැනීමට ලක් කිරීම.

2.1.15 **<u>නාවික හමුදාවට මුහුණ පෑමට සිදු වී ඇති අභියෝග</u>**

අ. නාවික හමුදා පිරිස් බලයෙහි ඌණතාවය සහ 2023 දෙසැම්බර් මස 31 වන දිනට පිරිස් බලය සම්බන්ධ විස්තර පහත පරිදි වේ.

විස්තරය	**අනුමත පිරිස් බලය**	**පවතින පිරිස් බලය**	**ඌණතාවය**
නිලධාරීන්	3734	3172	-562
නාවිකයින්	49266	41360	-7906
එකතුව	53000	44532	-8468

ආ. ශ්‍රී ලංකා නාවික හමුදාව සතුව පවතින විශාල නාවික යාත්‍රා නැංගුරම් ලෑම සඳහා ත්‍රිකුණාමල නාවික කඳවුරෙහි ඉදිකරමින් පවතින නාවික ජැටිය රටේ පැවති ආර්ථික අර්බුදය හමුවේ අත්හිටුවීමකින් තොරව ඉදිකිරීම් කටයුතු කරගෙන යාමට හැකිවීම සහ 2024 සහ 2025 වර්ෂ තුළ නිම කිරීමට අපේක්ෂා කෙරේ.

2.1.16 <u>නාවික හමුදාව ලඟා කර ගැනීමට නියමිත ප්‍රධාන ඉදිරි ඉලක්ක</u>

අ. ඉන්දියානු රජය මඟින් ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත පාවෙන තටාකාංගනයක් ප්‍රදානයක් වශයෙන් ලබා දීම සඳහා අවශ්‍ය ගිවිසුම් අත්සන් කර ඇත. මේ වන විට Goa Shipyard Ltd ආයතනය එය නිපදවීමේ කටයුතු ආරම්භ කර ඇති අතර, එම පාවෙන තටාකාංගනය 2025 වසර තුළ දී ශ්‍රී ලංකාවට ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවති.

ආ. ඇමෙරිකානු වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුවට අයත් අඩි 210ක් දිග (Ex USCG DESICIVE) නෞකාව ඇමරිකානු රජයේ ආධාරයක් වශයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ලබා ගැනීමට කටයුතු ආරම්භ කර ඇති අතර, අත්පත් කර ගැනීමේ වියදම වශයෙන් ඇ.ඩො.මි. 10ක් ඇස්තමේන්තු කර ඇති අතර, ශ්‍රී ලංකා රජයට ඉන් ඇ.ඩො.මි. 01ක වියදමක් දැරීමට සිදු වේ. මෙම නෞකාව 2025 පෙබරවාරි මාසයේ දී ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ලබා ගැනීමට සැලසුම් කර ඇත.

ඇ. ශ්‍රී ලංකා නාවික හමුදා පුද්ගලයින්ගේ සුභසාධනය සහ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ අරමුණින්, 2024 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ඵලදායී ලෙස යොදා ගනිමින් නව ඉදිකිරීම් ව්‍යාපෘති 25ක් සඳහා රු.මි. 440.00ක් ද යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘති 09ක් සඳහා රු.මි. 52.0ක් ද ගොඩනැගිලි ව්‍යුහ නවීකරණය සහ අලුත්වැඩියා කිරීමේ ව්‍යාපෘති 50ක් සඳහා රු.මි. 120.0ක් ද භාවිතා කර මුළු ව්‍යාපෘති 84ක් 2024 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

ඈ. රාජ්‍ය විද්‍යුත් හා ප්‍රසම්පාදන ලේකම් කාර්යාලය මඟින් ඉදිරිපත් කරන ලද E-Government Procurement System හි ලියාපදිංචි වීමේ කටයුතු මේ වන විට අවසන්ව ඇති අතර, ඉදිරියේදී රජය විසින් ක්‍රියාවට ගෙන ඇති රාජ්‍ය විද්‍යුත් හා ප්‍රසම්පාදන ක්‍රියාවට අනුව නාවික හමුදාව තුළ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට සැලසුම් කර ඇත.

ඉ. වේව් රයිඩර් වර්ගයේ වෙරළ ආරක්ෂක මුර යාත්‍රා 06ක් 2024 වර්ෂය තුළ නිෂ්පාදනය කිරීම.

ඊ. නාවික හමුදාව තුළ කඩදාසි භාවිතය අවම කිරීම සඳහා නව පරිගණක වෙබ් අඩවි නිර්මාණය කිරීම.

2.1.17 <u>නාවික හමුදාව තුළ සිදු කරන ප්‍රධාන ඉදිකිරීම් ව්‍යාපෘති</u>

අනු අංකය	ව්‍යාපෘතියේ නම	සිදු කරන ලද නාවික ප්‍රදේශය සහ ස්ථානය	ව්‍යාපෘතිය ආරම්භ කරන දිනය	ව්‍යාපෘතිය අවසන් කරන දිනය	අරමුදල ලබා දීම සම්බන්ධ විස්තර		අවසන් කර ඇති වැඩ ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස (2023 දෙසැම්බර් මස 31 වන දිනට)
					ඇස්තමේන්තු ගත මුදල	2023 දෙසැම්බර් මස 31 වන දිනට වියදම් කර ඇති මුදල	
1	ත්‍රිකුණාමලය නාවික තටාකාංගනයෙහි නාවික ජැටිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය	නැගෙනහිර නාවික පෙදෙස	24.03.2015	31.12.2024	4,611,360,000.00	2,647,600,000.00	40.13%
2	ත්‍රිකුණාමලය නාවික තටාකාංගනයෙහි දසමහල් නිලධාරි නිවස්නය ඉදිකිරීම	නැගෙනහිර නාවික පෙදෙස	01.12.2015	30.06.2024	450,000,000.00	292,440,000.00	98.25%
3	නාවික හා සාගරික විද්‍යාපීඨයේ නිලධාරි පුහුණු කිරීමේ සංචිතය ඉදිකිරීම	නැගෙනහිර නාවික පෙදෙස	20.02.2019	30.06.2024	390,800,000.00	345,530,000.00	71.0%

4	විශේෂ යාත්‍රා බලඝන මූලස්ථානයේ සිවිමහල් නිලධාරි නිවස්නය ඉදිකිරීම	නැගෙනහිර නාවික පෙදෙස	24.07.2019	20.12.2024	230,000,000.00	148,120,000.00	75.0%
5	ශ්‍රීලංනානෞ වළගම්බා ආයතනයේ නිරෝධායන මධ්‍යස්ථානයක් (අංක 01) ඉදිකිරීම	නැගෙනහිර නාවික පෙදෙස	18.12.2021	20.08.2023	52,400,000.00	31,850,000.00	100.0%
6	නාවික තටාකංගනයේ පෞරාණික ගොඩනැගිලි නැවත සකස් කිරීම	නැගෙනහිර නාවික පෙදෙස	10.12.2016	31.12.2024	55,430,000.00	47,240,000.00	88.5%
7	ශ්‍රීලංනානෞ විදුර ආයතනයේ පුහුණුවන නාවිකයන් සඳහා යුධ අභ්‍යාස පුහුණු ආකෘති ගොඩනැගිල්ලක් ඉදිකිරීම	නැගෙනහිර නාවික පෙදෙස	25.12.2021	31.12.2024	15,340,000.00	8,710,000.00	20.00%
8	ශ්‍රීලංනානෞ ගැමුණු ආයතනයේ වැටුප් හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පස් මහල් ගොඩනැගිල්ල ඉදි කිරීම	බටහිර නාවික පෙදෙස	04.08.2021	31.12.2024	218,000,000.00	56,350,000.00	29.30%
9	ශ්‍රීලංනානෞ ගැමුණු ආයතනයේ බහු කාර්යය ගොඩනැගිල්ලක් ඉදි කිරීම	බටහිර නාවික පෙදෙස	25.04.2021	28.02.2023	1079,000,000.00	1,023,058,976.00	100.0%
10	වැලිසර මහල් දහයකින් යුත් කනිෂ්ඨ නාවිකයින්ගේ විවාහක නිවාස ඉදිකිරීම (පළමු අදියර)	බටහිර නාවික පෙදෙස	28.08.2019	31.12.2025	754,000,000.00	16,000,000.00	13.05%
11	කොළඹ නාවික රෝහලහි බාහිර රෝගී අංශයේ රෝගීන් සඳහා පොරොත්තු ස්ථානයක් සහ රෙදි සෝදන කාමරයක් සමඟ දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම.	බටහිර නාවික පෙදෙස	23.06.2022	30.12.2023	16,500,000.00	10,466,000.00	100.0%
12	වැලිසර නිල නිවාස පරිශ්‍රයේ භූමි අලංකරණ කටයුතු සිදු කිරීම	බටහිර නාවික පෙදෙස	20.04.2023	30.12.2024	19,670,000.00	13,750,000.00	68.0%
13	ශ්‍රීලංනානෞ රුහුණ ආයතනයේ සයමහල් කණිෂ්ඨ නාවික නිවාසය ඉදිකිරීම	දකුණු නාවික පෙදෙස	01.04.2019	20.04.2024	140,000,000.00	140,200,000.00	91.84%

14	හම්බන්තොට නාවික හමුදා කඳවුරේ බහු කාර්යය ගොඩනැගිල්ල ඉදිකිරීම	දකුණු නාවික පෙදෙස	17.06.2017	30.12.2026	390,000,000.00	193,180,000.00	38.12%
15	ශ්‍රීලංනානෞ උත්තර ආයතනයේ විධාන නිලධාරි නිවස්නය ඉදිකිරීම	උතුරු නාවික පෙදෙස	15.05.2015	25.12.2024	450,000,000.00	225,810,000.00	64.72%
16	ශ්‍රීලංනානෞ එළාර ආයතනයේ විධාන නිලධාරි නිවස්නය ඉදිකිරීම	උතුරු නාවික පෙදෙස	13.05.2019	15.07.2023	60,000,000.00	59,810,000.00	100.0%
17	උතුරු නාවික විධානයේ වෙරළ නිරීක්ෂණ මුර කුටි 79ක් ඉදිකිරීම	උතුරු නාවික පෙදෙස	11.11.2016	25.12.2025	45,000,000.00	32,850,000.00	66.0%
18	ශ්‍රීලංනානෞ උත්තර ආයතනයේ විධාන මෙහෙයුම් මැදිරිය ඉදිකිරීම	උතුරු නාවික පෙදෙස	09.01.2022	31.07.2023	35,000,000.00	30,060,000.00	100.0%
19	ශ්‍රීලංනානෞ එළාර ආයතනයේ අංක 01 ජැටිය වැඩිදියුණු කිරීම	උතුරු නාවික පෙදෙස	20.08.2023	31.12.2024	59,710,000.00	11,750,000.00	15.1%
20	ශ්‍රීලංනානෞ කංචදේව ආයතනයේ සංඥා කුළුණ අලුත්වැඩියා කිරීම	උතුරු නාවික පෙදෙස	01.09.2023	10.12.2023	10,150,000.00	9,940,000.00	100.0%
21	ශ්‍රීලංනානෞ ගජබා ආයතනයේ ඔලුතුඩායි වෙත විතැන් කිරීමේ ව්‍යාපෘතිය	උතුරු මැද නාවික පෙදෙස	03.02.2017	31.12.2027	369,190,000.00	236,490,000.00	60.85%
22	උතුරු මැද නාවික විධානයේ වෙරළ නිරීක්ෂණ මුර කුටි ඉදිකිරීම	උතුරු මැද නාවික පෙදෙස	03.05.2017	30.12.2026	55,460,000.00	44,410,000.00	53.85%
23	උතුරු මැද නාවික විධානයේ කොවිඩ් 19 ආශ්‍රිත නිරෝධායන මධ්‍යස්ථානවල ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකිරීම - (නාවික නිවාස සහ නාන කාමර වැඩිදියුණු කිරීම)	උතුරු මැද නාවික පෙදෙස	25.10.2020	31.12.2024	31,200,000.00	17,490,000.00	77.0%
24	ශ්‍රීලංනානෞ මහානාග ආයතනයේ ජල බෙදා හැරීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීම	ගිණිකොන නාවික පෙදෙස	21.08.2019	15.12.2023	48,700,000.00	48,540,000.00	100.0%
25	ශ්‍රීලංනානෞ විජය ආයතනයේ තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම	වයඹ නාවික පෙදෙස	06.07.2019	30.12.2025	250,000,000.00	146,230,000.00	50.9%

<u>ත්‍රිකුණාමලය නාවික තටාකංගනයෙහි නාවික ජැටිය ඉදිකිරීමේ ව්‍යාපෘතිය</u>





<u>ත්‍රිකුණාමලය නාවික තටාකංගනයෙහි දසමහල් නිලධාරි නිවස්නය ඉදිකිරීම</u>





<u>නාවික හා සාගරික විද්‍යාපීඨයේ නිලධාරි පුහුණු කිරීමේ සංචිතය ඉදිකිරීම</u>





<u>විශේෂ යාත්‍රා බලඝන මූලස්ථානයේ සිව් මහල් නිලධාරි නිවස්නය ඉදිකිරීම</u>





ශ්‍රීලංනානෞ වළගම්බා ආයතනයේ නිරෝධායන මධ්‍යස්ථානයක් (අංක 01) ඉදිකිරීම





ශ්‍රීලංනානෞ විදුර ආයතනයේ පුහුණුවන නාවිකයන් සඳහා යුධ අභ්‍යාස පුහුණු ආකෘති ගොඩනැගිල්ලක් ඉදිකිරීම





නාවික තටාකංගණයේ පෞරාණික ගොඩනැගිලි නැවත සකස් කිරීම





ශ්‍රීලංනානෞ ගැමුණු ආයතනයේ වැටුප් හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ පස් මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම





ශ්‍රීලංනානෞ ගැමුණු ආයතනයේ බහු කාර්යය ගොඩනැගිල්ලක් ඉදිකිරීම





වැලිසර මහල් දහයකින් යුත් කනිෂ්ඨ නාවිකයින්ගේ විවාහ නිවාස ඉදිකිරීම





කොළඹ නාවික රෝහලහි බාහිර රෝගී අංශයේ රෝගීන් සඳහා පොරොත්තු ස්ථානයක් සහ රෙදි සෝදන කාමරයක් සමඟ දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම.





වැලිසර නිල නිවාස පරිශ්‍රයේ භූමි අලංකරණ කටයුතු සිදු කිරීම





ශ්‍රීලංනානෞ රුහුණ ආයතනයේ සයමහල් කණිෂ්ඨ නාවික නිවාසය ඉදිකිරීම





ශ්‍රීලංනානෞ කාවන්තිස්ස ආයතනයේ පස් මහල් නාවික නිවාස ගොඩනැගිල්ල ඉදිකිරීම





ශ්‍රීලංනානෞ උත්තර ආයතනයේ විධාන නිලධාරි නිවාසය ඉදිකිරීම



වම් පස



දකුණු පස

ශ්‍රීලංනානෞ එළාර ආයතනයේ විධාන නිලධාරි නිවස්නය ඉදිකිරීම



වම් පස



දකුණු පස


උතුරු නාවික විධානයේ වෙරළ නිරීක්ෂණ මුර කුටි ඉදිකිරීම





ශ්‍රීලංනානෞ උත්තර ආයතනයේ විධාන මෙහෙයුම් මැදිරිය ඉදිකිරීම





ශ්‍රීලංනානෞ එළාර අංක 01 ජැටිය වැඩිදියුණු කිරීම





ශ්‍රීලංනානෞ කංචදේව සංඥා කුළුණ අලුත්වැඩියා කිරීම







ශ්‍රීලංකානෞ ගජබා ආයතනය ඔලුතුඩායි වෙත විතැන් කිරීමේ ව්‍යාපෘතිය



කණිෂ්ඨ නාවික නිවාසය



නිලධාරි නිවාසය



පරිපාලන ගොඩනැගිල්ල



ජල ටැංකි රදවනය



සංඥා කුළුණ



ප්‍රධාන දොරටුව

උතුරු මැද නාවික විධානයේ වෙරළ නිරීක්ෂණ මුර කුටි ඉදිකිරීම





<u>උතුරු මැද නාවික විධානයේ කොවිඩ් 19 ආශ්‍රිත නිරෝධායන මධ්‍යස්ථානවල ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීම - (නාවික නිවාස සහ නාන කාමර වැඩිදියුණු කිරීම)</u>





<u>ශ්‍රීලංනානෞ මහානාග ආයතනයේ ජල බෙදා හැරීමේ පද්ධතිය ක්‍රියාත්මක කිරීම</u>





<u>ශ්‍රීලංනානෞ විජය ආයතනයේ තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම</u>



අදියර I



අදියර II

2.2 <u>නාවික හමුදාවේ ඉදිරි දැක්ම</u>

2.2.1 <u>ප්‍රගතිය සහ ඉදිරි දැක්ම</u>

අ. නාවික හමුදාවේ සංවර්ධනය සඳහා අවශ්‍ය සැලැස්මක් ශ්‍රී ලංකා නාවික හමුදාවේ සමුද්‍ර උපාය මාර්ගය 2025 යන ලේඛනය මඟින් 2017 වර්ෂයේදී ප්‍රකාශයට පත්කොට තිබූ අතර, එම සැලැස්ම තවදුරටත් 2030 වර්ෂය දක්වා නාවික හමුදාවේ ප්‍රධාන නෞකා සහ යාත්‍රා අවශ්‍යතාවයන් මත පහත සඳහන් වගුවේ ආකාරයට ක්‍රමාණුකූලව සංවර්ධනය කර ගැනීම සඳහා සැලසුම් කර ඇත.

යාත්‍රාව/ යාත්‍රා වර්ගය	**2022**	**2023**	**2024**	**2025**	**2026**	**2027**	**2028**	**2029**	**2030**	සමස්ත
ෆ්‍රිගේට්	-	-	-	සටහන i.	-	-	-	-	-	-
කොර්වෙට්ස්	-	-	01	-	-	-	-	-	-	01
අක්වෙරළ නිරී ණ මුර යාත්‍රා (OPV)	09	-	01 (10)	-	-	-	-	-	-	10
වේග මිසයිල යාත්‍රා (FMV)	02	-	-	-	-	-	-	-	-	02
වේග මුර යාත්‍රා (FPB)	-	02	-	02 (04)	-	02 (06)	-	02 (08)		08
වේග ප්‍රහාරක යාත්‍රා (FAC)	49	-	-	-	-	-	-	-	-	49
ගොඩබෑමේ යාත්‍රා (LST/ LCM/ LCU)	07			01 (08)				01 (09)	-	09
ගුවන් යානා අංශය	-	සටහන ii.	-	සටහන iii.	-	-	-	-	-	02
නියමුවන් රහිත ගුවන් යානා (UAV)	-	සටහන iv							-	02
වෙරළාරක්ෂක මුර යාත්‍රා (CPC)	06	01								07
වෙරළාරක්ෂක යාත්‍රා (IPC)	107	06	06	06	06	06	06	06	06	155

සටහන -

i. මෙම අවශ්‍යතාවය නැවත සලකා බැලිය යුතුය.
ii. ඩෝනියර් ගුවන් යානා අත්පත් කර ගැනීම.
iii. Rotor wing ඒකකය ස්ථාපිත කිරීම.
iv. UAV දෙකක් අත්පත් කර ගැනීම සමඟ ඒකකය ස්ථාපනය කිරීම.

ආ. 2023 වර්ෂයේදී අත්පත් කරගැනීමට යෝජනාවී තිබූ වේග මුර යාත්‍රා දෙක 2022 ජුනි මස 02 දිනැති BD/NSLE/103/6/2021 දරන භාණ්ඩාගාර ලේකම් ගේ ලිපිය මගින් රාජ්‍ය වියදම් පාලනයට උපදෙස් ලබා දී ඇති බැවින් අත්පත් කර ගැනීමට නොහැකි විය.

ඇ. ශ්‍රීලංනානෞ විජයබාහු (EX USCG Douglas Munro) 2022 දෙසැම්බර් මාසයේදී ශ්‍රී ලංකා නාවික හමුදාවට සම්බන්ධ විය.

ඈ. 2023 වසර සඳහා වැලිසර නාවික යාත්‍රා තැනීමේ අංගනයේ හි නිපදවීමට තිබූ IPC යාත්‍රා ගණන 3ක් දක්වා අඩුකල අතර, අත්‍යාවශ්‍ය අමුද්‍රව්‍ය, යන්ත්‍ර නිසි කලට නොලැබීම හේතුවෙන් එම ඉදිකිරීම් ද මේ වන තෙක් ආරම්භ කර නොමැත.

ඉ. 2023 වර්ෂය සඳහා ඩෝනියර් ගුවන් යාත්‍රා අත්පත් කර ගැනීම සඳහා සැලසුම් කර තිබූ අතර, එය අරමුදල් ලබා ගැනීමේ හැකියාව සලකා බලා අනාගතයේදී සලකා බලනු ඇත.

ඊ. නියමිත UAVS දෙකක් අත්පත් කර ගැනීම තවමත් සිදු කර නොමැත.

2.2.2 **<u>ශ්‍රී ලංකා නාවික හමුදාවේ දැක්ම - 2024</u>**

අ. දිවයින වටා පවතින කි.මී 1340 ක පමණ වෙරළ තීරය, ගොඩබිම සිට මූලික රේඛාවේ 12 NM දක්වා පවතින දේශීය ජල තීරය (ගොඩබිමේ විශාලත්වයෙන් 1/3 ක පමණ) යාබද මුහුදු කලාපය (මූලික රේඛාවේ 24NM දක්වා), අනන්‍ය ආර්ථික කලාපය, (මූලික රේඛාවේ සිට 200NM දක්වා ඇතුළු වර්ග කි.මී. 1,712,452 පමණ වන සුවිසල් මුහුදු තීරය යන කලාපයන්හි ආරක්ෂාව, සෙවුම් කටයුතු සහ මුදවා ගැනීමේ මෙහෙයුම් සිදු කිරීම සහ එහි වගකීම ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් දරනු ලබයි. තවද, ඉන්දියන් සාගරයේ ප්‍රධාන මුහුදු මාර්ගයේ කේන්ද්‍රගතව අප මාතෘ භූමිය පිහිටා ඇති අතර, ලෝකයේ තෙල්වලින් 66% ක්, තොග භාණ්ඩ වලින් 40% ක් සහ බහාලුම් නැව්ගත කිරීම් වලින් 60% ක් හුවමාරු වන්නේ එම මාර්ගය හරහාය. තවද, සාගර කලාපවල පවත්නා ආරවුල්, අර්බුද සහ ගැටුම් හරහා ඇති වී තිබෙන අන්තර්ජාතික ආරක්ෂක තත්වය හා භූ දේශපාලනික වතාවරණය සෘජුවම ශ්‍රී ලංකාවේ ආරක්ෂාවට විශේෂ වැදගත්කමක් ඇති කරනු ලබන අතර ශ්‍රී ලංකාවට අයත් සාගර කලාපවල ආරක්ෂාව සම්බන්ධයෙන් වගකීම නාවික හමුදාවට දැරීමට සිදු වේ.

ආ. එපමණක් නොව වර්තමාන සතුරු ක්‍රියාකාරකම් සලකා බැලීමේ දී ඒවා සූක්ෂම, ජාලගත සහ සාම්ප්‍රදායික නොවන බව හඳුනාගෙන ඇත. එබැවින් ත්‍රස්තවාදී තර්ජන, ජාත්‍යන්තර අපරාධ, මුහුදු මංකොල්ලකෑම් හා තහනම් ධීවර කටයුතු යනාදිය තුළින් ඉන්දියන් සාගරය දැඩි අවදානමකට ලක්විය හැකිය. එම අවදානමට මුහුණ දීමට අප නාවික හමුදාව ශක්තිමත් විය යුතු අතර, මෙලෙස අභියෝග බවට පත්ව ඇති ඉන්දියන් සාගර කලාපය තුළ සිදු වන නීතිමය නොවන, වාර්තා නොවන හා විධිමත් නොවන ධීවර කටයුතු (IUU) පිළිබඳව කටයුතු කිරීම ප්‍රධාන අභියෝගයක් වන අතර, එය ශ්‍රී ලංකාව මෙන්ම අනෙකුත් කලාපීය රටවල ආරක්ෂාවට ද තර්ජනයක් විය හැකිය.

ඇ. ඉහත කරුණු සලකා බැලීමේදී, ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ඉන්දියන් සාගර කලාපය තුළ බුද්ධි තොරතුරු ලබා ගැනීම, ආවේක්ෂණ හා නිරීක්ෂණ කටයුතු වැඩි දියුණු කර ගැනීම සහ ඔත්තු බැලීමේ හැකියාව වැඩි දියුණු කරගැනීම මඟින් කලාපය තුළ ශ්‍රී ලංකා රාජ්‍යයේ සමුද්‍රීය ස්වෛරීභාවය ඇතිකර ගැනීමට හා අනාගතයේ ඇතිවිය හැකි අභියෝග පිළිබඳව දැනුවත් වී සිටීමට උපකාරී වේ.

2.2.3 **<u>ශ්‍රී ලංකා නාවික හමුදාවේ දැක්ම යටතේ යෝජිත ව්‍යාපෘති පිළිබඳ විස්තර</u>**

අ. ශ්‍රී ලංකා නාවික හමුදාවේ නෞකා බලඝණය ශක්තිමත් කිරීමෙන් අප මුහුදු සීමාවේ ආරක්ෂාව සහතික කර එම මුහුදු සීමාව සියලු ජාතීන්ගේ නිදහස් නෞකා ගමනාගමනයන් නිසි ආරක්ෂාවකින් සිදු කිරීමට සහ සියලු නාවික කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාමට මඟ සැලසීම. මෙම වගකීම නිසි අයුරින් ඉටු කිරීම සඳහා අප හා සම්බන්ධව සිටින මිත්‍ර රටවල සහයෝගයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාවට නෞකාවන් ලබා ගැනීමට කටයුතු කිරීම.

ආ. නෞකා තුළ යල්පැනගිය පද්ධති හා උපකරණ ප්‍රතිස්ථාපනය කිරීම, විශේෂයෙන්ම සන්නිවේදන උපකරණ, ක්ෂුද්‍ර තරංග සම්බන්ධතා සඳහා අවශ්‍ය පද්ධති ප්‍රතිස්ථාපණය කිරීම තුළින් ශ්‍රී ලංකා නාවික හමුදාවේ නාවික මෙහෙයුම් ශක්තිය වැඩි දියුණු කර ගැනීම සහ ඉන්දීය සාගරික කලාපය තුළ සිදු විය හැකි සිදුවීම් සම්බන්ධව කල්වේලා ඇතිව දැන ගැනීමේ හැකියාව වර්ධනය කර ගැනීම.

ඇ. එක්සත් ජනපද රජයෙන් විදේශ හමුදා ආධාර යටතේ සංවේදක ස්ථාපනය කිරීමෙන්, ශ්‍රී ලංකාව තුළ මිනිස් ජාවරම්, මත්ද්‍රව්‍ය ජාවාරම් සහ අනෙකුත් සංවිධානාත්මක අපරාධ වැනි විවිධ අභියෝගවලට ඵලදායී ලෙස මුහුණ දීම.

ඈ. ඉන්දියානු රජයේ ආධාර යටතේ සමුද්‍රීය ගලවා ගැනීමේ සම්බන්ධීකරණ මධ්‍යස්ථානය පිහිටුවීම තුළින් ශ්‍රී ලංකාවේ සෙවීම් සහ මුදවාගැනීමේ කලාපයේ (වර්ග කිලෝමීටර් 1,712,452 ක ප්‍රමාණයක් එනම් රටෙහි භූමි ප්‍රමාණය මෙන් 27 ගුණයක්) ආපදාවකදී අත්‍යවශ්‍ය වන මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම සඳහා සහ ගුවන් හා මුහුදු ගලවාගැනීමේ සම්බන්ධීකරණ කටයුතු ශක්තිමත් කර ගැනීම.

ඉ. ශ්‍රී ලංකාව තුළ පවතින මූල්‍ය අස්ථාවරත්වය හමුවේ අප බලාපොරොත්තු වන විදේශ ආදායම උපයාගැනීමට උපයෝගි වන ලෙබනන් රාජ්‍යයේ යොදවා ඇති එක්සත් ජාතීන්ගේ සමුද්‍රීය කාර්ය සාධක බලකාය සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ නෞකාවන් සහ පුද්ගලයින් යෙදවීමට සුදුසු කටයුතු සොයා බැලීම.

ඊ. ශ්‍රී ලංකා නාවික හමුදා පුද්ගලයින්ගේ පුහුණු කටයුතු යාවත්කාලීන කිරීම සඳහා අවශ්‍ය දැනුම ඉන්දියාව, ඔස්ට්‍රේලියාව, චීනය, බංගලාදේශය සහ පාකිස්තානය වැනි මිත්‍ර නාවික හමුදාවලින් උපකාර ලබා ගැනීමෙන් නාවික පුද්ගලයන්ගේ තාක්ෂණික, ප්‍රායෝගික හැකියාවන්, පරිපාලන හා කළමණාකරණ බුද්ධිය වර්ධනය කිරීම.

.....

ප්‍ර.ග.නි./ ග.නි./ ආයතන ප්‍රධානියා

UVMP PERERA, RSP**, USP, ndu, psc
Vice Admiral
COMMANDER OF THE NAVY

03 පරිච්ඡේදය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 **මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

ඒසිඒ - එෆ්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය (වර්තමාන වර්ෂය) - 2023		සටහන	තත්‍ය		
			වර්තමාන වර්ෂය (2023) (රු)	ඉකුත් වර්ෂය (2022) (රු)	
-	ආදායම් ලැබීම්		**900,000,000.00**	**247,000,000.00**	
-	ආදායම් බදු	1	-	-	ඒසිඒ -1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
850,000,000.00	බදු නොවන ආදායම් සහ වෙනත්	4	900,000,000.00	247,000,000.00	
850,000,000.00	**මුළු ආදායම් ලැබීම් (අ)**		**900,000,000.00**	**247,000,000.00**	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		64,759,247,909.00	55,435,649,451.00	ඒසිඒ -3
-	තැන්පතු		1,105,824,336.00	754,179,788.00	ඒසිඒ -4
-	අත්තිකාරම් ගිණුම්		3,088,366,686.00	1,249,618,422.00	ඒසිඒ -5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**68,953,438,931.00**	**57,439,447,660.00**	
-	**මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ=(අ) + (ආ)**		**69,853,438,931.00**	**57,686,447,660.00**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		**4,829,842.00**	**60,505,650.00**	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ=(ඇ) - (ඇ)		**69,848,609,089.00**	**57,625,942,010.00**	
	අඩු කළා: වියදම				
-	පුනරාවර්තන වියදම්		-	-	
41,825,100,000.00	වේතන වැටුප් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	41,823,188,807.00	41,238,526,346.00	ඒසිඒ - 2 (II)
24,844,780,000.00	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	24,798,925,463.00	14,331,609,707.00	
38,000,000.00	සහනාධාර, ප්‍රදාන සහ මාරු කිරීම්	7	37,684,289.00	43,859,745.00	
-	පොළී ගෙවීම්	8	-	-	
2,825,000.00	වෙනත් පුනරාවර්තන වියදම්	9	2,647,047.00	112,500.00	ඒසිඒ - 2 (II)
66,710,705,000.00	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**66,662,445,605.00**	**55,614,108,298.00**	
	මූලධන වියදම්				
4,734,622,000.00	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම්	10	4,733,140,792.00	1,902,228,836.00	

1,501,081,000.00	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	1,456,897,331.00	2,001,321,494.00	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	515,200,000.00	
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
270,000,000.00	හැකියා වර්ධනය	14	269,467,710.00	352,241,142.00	
696,397,000.00	වෙනත් මූලධන වියදම්	15	689,018,428.00	1,043,909,048.00	
7,202,100,000.00	**මුළු මූලධන වියදම (උ)**		**7,148,524,261.00**	**5,814,900,519.00**	
	තැන්පතු ගෙවීම්		883,349,464.00	776,684,126.00	ඒසිඒ-4
-	**අත්තිකාරම් ගෙවීම්**		3,683,923,085.00	1,383,105,898.00	ඒසිඒ- 5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
-	**ප්‍රධාන ලෙජර් වියදම (ඌ)**		**4,567,272,550.00**	**2,159,790,024.00**	
	මුළු වියදම එ = (ඊ+උ+ඌ)		**78,378,242,416.00**	**63,588,798,841.00**	
-	දෙසැම්බර් 31 දිනට **ශේෂය ඒ=(ඉ-එ)**		**(8,529,633,327.00)**	**(5,962,856,832.00)**	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(8,529,633,327.00)	(5,964,744,421.00)	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	1,887,589.00	ඒසිඒ-3
			(8,529,633,327.00)	(5,962,856,832.00)	

3.3 **මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය**

ඒසීඒ- පී

2023 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය	
5.2 තිරසාර අරමුණු සඳහා ලභාවීමට අදාළව නාවික හමුදාවේ විවිධ දෙපාර්තමේන්තු මඟින් විවිධ ක්‍රියාකාරකම්වල නියැලෙන නමුත් එම තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග ලභා කරගන්නා ආකාරය සම්බන්ධයෙන් උක්ත ආකෘතිය පරිදි ප්‍රතිශාතාත්මක ඇගයීමක් සිදු කිරීම ප්‍රායෝගිකව දුෂ්කරය.

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 **සේවක සංඛ්‍යා කළමනාකරණය**

නාවික

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු**
නිලධාරීන්	3734	3172	562
නාවිකයින්	49266	41360	7906

නාවික සිවිල්

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු**
ජ්‍යෙෂ්ඨ	10	8	2
තෘතීයික	13	10	3
ද්විතීයික	145	74	71
ප්‍රාථමික	1768	1197	571

6.2 ශ්‍රී ලංකා නාවික හමුදාවේ සේවා පුද්ගලයින් හා සිවිල් පුද්ගලයින් යන අංශ දෙකෙහිම පුරප්පාඩු පවතී.

අ. **නාවික**

නාවික හමුදාවේ අනුමත සේවක සංඛ්‍යාවට සාපේක්ෂව 15.97% කට අධික පුරප්පාඩු පවතින නමුත් දැනට පවතින මානව සම්පත කළමනාකරණය කිරීමෙන් රාජකාරි කටයුතු පවත්වාගෙන යනු ලබයි.

ආ. **නාවික සිවිල්**

(1) නාවික හමුදාවේ සිවිල් සේවක සංඛ්‍යාව අනුමත සේවක සංඛ්‍යාවට සාපේක්ෂව 33.42% කට අධික පුරප්පාඩුවක් පවතී.

(2) ප්‍රාථමික ද්විතියික හා තෘතික මට්ටමේ තනතුරුවල පවතින පුරප්පාඩු දෙපාර්තමේන්තුවේ මානව සම්පත් හිඟයට හේතු වී ඇති අතර, එය මෙම දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය අඩු කිරීමට සැළකිය යුතු බලපෑමක් සිදු කර ඇත.

6.3 **මානව සම්පත් සංවර්ධනය**

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබාගත් දැනුම*
			දේශීය	විදේශීය		
දේශීය පුහුණු (අභ්‍යන්තර)	8301	2023 ජනවාරි මස 01 වන දින සිට 2023 දෙසැම්බර් 31 දක්වා	30,000,000.00	-	දේශීය	මානව සම්පත් සංවර්ධනය
දේශීය පුහුණු (බාහිර)	2650		25,972,905.79	-	දේශීය	
විදේශීය පුහුණු	447		-	183,750,000.00	විදේශීය	
නාවික විභාග පැවැත්වීම	84531		690,230.00		දේශීය	
එකතුව	95929		56,663,135.79	183,750,000.00	-	

නාවික හමුදා නිලධාරීන් සහ නාවිකයින්ගේ වෘත්තීන්ට අදාළව දැනුම සහ තාක්ෂණය හුවමාරු කර ගැනීම තුළින් නාවික හමුදාවට ඵලදායී සේවයක් ලබා ගැනීමට හැකි වීම.

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-		
1.6	වෙනත්	-		
2	පොත්පත් හා ලේඛන (මූ.රෙ 445)			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙණුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිත කිරීමේ දී ගණකාධිකාරිවරයාගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		

4.4	වාර්ෂික ඇස්මේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ 134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 2ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		

8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූලවේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලවේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූලවේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ 772 අනුව සිදු කිරීම	අනුකූලවේ		

9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල නොවේ	දැනට නාවික හමුදාව සතුව වාහන 4000ක ප්‍රමාණයන් තිබෙන අතර, එවා දිවයින පුරා පිහිටි නාවික හමුදා කඳවුරු වෙත අනුයුක්ත කර ඇති අතර, මෙලෙස එම වාහන වල දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ වාර්තා විගණකාධිපති වෙත යැවීම ප්‍රායෝගික නොවේ.	වාහනවල දෛනික ධාවන සටහන් එම වාහන අදාළ ආයතනයේ පවත්වා ගනු ලබන බැවින්ද, මාසික සාරංශ වාර්තා අදාළ ආයතනය වෙතින් මාසිකව නාවික හමුදා මූලස්ථානය වෙත ගෙන්වා ගනු ලබන බැවින් එම වාර්ථා විගණන කටයුතු සඳහා විගණනය වෙත අවශ්‍ය වූ විට නාහමු වෙතින් ඉදිරිපත් කිරීමට යෝජනා කෙරේ.
9.2	වාහන ගර්භිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	නාවික හමුදාවේ සීමිත වාහන සංඛ්‍යාවක් පවතින අතර, එක් වාහනයක් අපහරණය කිරීමේ දී එම වාහනය වෙනුවට අනුප්‍රාප්තික වාහනයක් ලබා දීම අත්‍යවශ්‍ය කරුණකි. එලෙස ලබා නොදීම තුළින් නාවික හමුදා කඳවුරු වෙත පවරා ඇති රාජකාරින් ඉටු කිරීමේ දී දැඩි අපහසුතාවයන්ට ලක් වේ. තවද, රටෙහි පවතින ආනයනික සීමා හා ආර්ථික තත්වය හේතුවෙන් නව වාහන මිලදී ගැනීම ද ප්‍රායෝගික තත්වයක නොපවතී ඒ අනුව නාවික හමුදාව අත්‍යවශ්‍යම වාහන පමණක් අපහරණය කරනු ලබයි. කරුණු එසේ වෙතත් වාහන අලුත්වැඩියාව සඳහා ලබා දෙනු ලබන ප්‍රතිපාදන සීමා කිරීම, වාහන අලුත්වැඩියා කාලය ප්‍රමාද වීමට බලපාන ප්‍රධානම කරුණු බව නිරීක්ෂණය වේ.	අපහරණය කරනු ලබන වාහන සඳහා අනුප්‍රාප්තික වාහන දීම වෙනුවෙන් නව වාහන මිලදී ගැනීමට සුදුසු ක්‍රමවේදයක් සැකසීමට යෝජනා කෙරේ. ඉහත පරිදි නව වාහන මිලදි ගැනීමට අපහසු වන්නේ නම් නාවික හමුදා වාහන අලුත්වැඩියා කිරීම වෙනුවෙන් ප්‍රමාණවත් ප්‍රතිපදන වෙන් කිරීමට යේජනා කෙරේ.
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල් බදු කාල සිමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ 94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොයික්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		

12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කිරීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රීම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රීම එම කාර්යය අවසන්වී මාසයක් ඇතුළත නිරවුල් කිරීම	අනුකූල වේ		
14.3	මු.රෙ 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රීම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රීම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූල වේ		

15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	හිඟ ආදායම් නොමැත	
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්යමණ්ඩල සීමාව තුළ කාර්යමණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා සෘජුවම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් නොකරන අතර, එම වාර්තා මාසිකව සහ ත්‍රෛයිමාසිකව ආරක්ෂක අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබයි	
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවි හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරන රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	-	-	
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදන කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	-	-	
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/ 2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	වාර්ෂිකව නාවික හමුදාවේ ඒ ඒ අංශයන් සඳහා පුද්ගලයින් බඳවා ගැනීමට අදාළව සැලසුම් සකස් කිරීම	
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්යමණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	නාවික හමුදාවේ පවතින රාජකාරි ස්වභාවය හා ක්‍රියා පටිපාටියට අනුව රාජකාරීන් හා වගකීම් පවරනු ලබන අතර, අවස්ථානුකූලව ඊට අදාළ ගිවිසුම්ගත වීම් සිදු කරනු ලබයි	
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ		

20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } ඩී්එන්/බී/එස්එල්එන්/2023/02/15 මගේ අංකය
உமது இல.
Your No. } දිනය
திகதி
Date } 2024 මැයි 31 දින

නාවික හමුදාධිපති
ශ්‍රී ලංකා නාවික හමුදාව

ශීර්ෂය 223 - ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යටෝක්ත වාර්තාව සහ සුහුනික කළ මූල්‍ය ප්‍රකාශන මේ සමඟ එවා ඇත.

ජේ.සුනිල් ශාන්ත
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් :- 1. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව

2. ලේකම් - භාරකාරක අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

මගේ අංකය எனது இல. My No. } සීඊඑන්/බී/එස්එල්එන්/2023/02/15 ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2024 මැයි 31 දින

නාවික හමුදාධිපති
ශ්‍රී ලංකා නාවික හමුදාව

ශීර්ෂය 223 - ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 223 - ශ්‍රී ලංකා නාවික හමුදාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළුත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික හමුදාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා නාවික හමුදාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම් වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි

අනර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම් සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම් පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම්.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වී නිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර නිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිලිබඳ අදහස් දැක්වීම

1.6.1 පුනරාවර්තන වියදම්

(ඇ) අංක 09/2022 දරන 2022 දෙසැම්බර් 27 දිනැති අයවැය චක්‍රලේඛයේ 02 වගන්තිය ප්‍රකාරව 2023 වර්ෂයට අදාළ විස්තරාත්මක අයවැය ඇස්තමේන්තුවල පූර්විකාවේද අවධාරණය කර ඇති පරිදි වාර්ෂික අයවැය ඇස්තමේන්තු මඟින් වෙන් කර දී ඇති ප්‍රතිපාදන සීමාවන් නොඉක්මවන පරිදි වියදම් කළමනාකරණය කර ගැනීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ. ගණන්දීමේ නිලධාරීන්ගේ මෙන්ම විෂයභාර නිලධාරීන්ගේද වගකීම වුවද. සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 21 ක ශුද්ධ ප්‍රතිපාදනය රු. 31.975.880.000 ක් වුවත් ඒවායෙහි මුළු වියදම් රු. 41.647.496.659 ක් වීමෙන් ශුද්ධ ප්‍රතිපාදනය ඉක්මවා සියයට 1 සිට සියයට 130 දක්වා වූ පරාසයක රු. 9.671.616.659 ක වියදම් සමාලෝචිත වර්ෂය තුළදී දරා තිබීමෙන් එම වටිනාකම්වලින් බැරකම් වලට සමාලෝචිත වර්ෂය තුළදී එළඹ තිබුණි.

(ආ) නාවික හමුදාවේ පුනරාවර්තන වැය විෂයයන් 05 කින් හා ප්‍රාග්ධන වැය විෂයයන් 13 කින් රු. 5.294.900.000 ක ප්‍රතිපාදන ශ්‍රී ලංකා යුධ හමුදාවට මාරුකර තිබීමෙන් සමාලෝචිත වර්ෂයට අදාළ එම වැය විෂයයන්හි බැරකම් රු. 9.264.105.756 කින් වැඩි වී නිබුණි.

(ඇ) ඉන්ධන ප්‍රතිපූර්ණය කර ගැනීමකින් තොරව ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත ශ්‍රී ලංකා වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ රු. 529.718.353 ක ඉන්ධන වියදම් ශ්‍රී ලංකා නාවික හමුදාවේ ප්‍රතිපාදනවලින් දරා නිබුණු අතර එය දෙපාර්තමේන්තුවේ අග්‍රිම් සැසඳුම් ප්‍රකාශයට වියදමක් ලෙස ගෙන නොනිබුණි.

1.6.2 මූලධන වියදම්

ශ්‍රී ලංකා නාවික හමුදාවේ ප්‍රාග්ධන වැය විෂයයන් යටතේ වූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වත්කම් අත්පත් කර ගැනීමට නිබූ රු. 152.890.000 ක් හා යටිතල පහසුකම් සංවර්ධනයට නිබූ රු.190.027.000 ක් ශ්‍රී ලංකා යුධ හමුදාවට මාරුකිරීම් හේතුවෙන් නාවික හමුදාවේ ප්‍රාග්ධන වත්කම් සංවර්ධනය අඩාලවීමෙන් ඉදිරි මෙහෙයුම් කාර්යන් හි කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය දුර්වලවීමට හේතුවිය හැකිබව නිරීක්ෂණය කරනු ලැබේ.

1.6.3 අත්තිකාරම් ගෙවීම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම

(i) 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අත්තිකාරම් බී ගිණුමේ කේවල ශේෂ වර්ගීකරන සාරාංශය අනුව නාවික පුද්ගලයින් 266 දෙනෙකුගෙන් 2001 වර්ෂයේ සිට අයවිය යුතු රු. 15.671.072 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අය වී නොතිබුණි. අයකර ගැනීම් පිලිබඳව ප්‍රමාණවත් ලිපිගොණු පවතින බවට තහවුරු කර ගෙන තිබූ රු. 25.000 ට වැඩි ශේෂයන් පවතින නාවික පුද්ගලයින් 230 කගෙන් අයවිය යුතු රු. 13.754.080 ක් කපා හැරීම් සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමුකර නිබුණි. ඉතිරි නාවික පුද්ගලයින් 36 දෙනෙකුගෙන් අයවිය යුතු රු. 1.916.992 ක් සම්බන්ධයෙන් අයකර ගැනීම් පිලිබඳව ලිපිගොණු අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව මගින් තහවුරු කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ii) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ දෙපාර්තමේන්තු පාලන ගිණුමේ දක්වා ඇති ණය ශේෂය රු. 523.138.367 ක් වුවද, කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අනුව ණය ශේෂය රු. 501.512.741 ක් වීමෙන් සමාලෝචිත වර්ෂය අවසාන දිනට එම ශේෂයන් අතර රු. 21.625.626 ක වෙනසක් පැවතුණි. 2001 වර්ෂයේ සිට පැවත එන මෙම වෙනස සම්බන්ධයෙන් භාරකෂක අමාත්‍යාංශය මගින් පත් කර තිබුණු කමිටුවේ වාර්තාව අනුව මෙම වෙනස පරීක්ෂා කිරීමට පොන්පත් සහ ගිණුම් සාරාංශ නාවික හමුදාව සතුව නොමැති බැවින් භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී සුදුසු ක්‍රියාමාර්ග ගැනීම හා නාවික නිති අංශය මැදිහත් වීමෙන් ඉදිරි කටයුතු සිදු කිරීම

සුදුසු බවට නිර්දේශ කර නිබුණද. සමාලෝචිත වර්ෂය අවසාන දිනට ණය හා අන්තිකාරම් පාලන ගිණුමේ වෙනස එලෙසම පැවතුණි.

(iii) කේවල ශේෂ වර්ගීකරණ සාරාංශය අනුව අවුරුදු එකත් දහයත් අතර කාලයක සිට සේවය හැරගිය සේවකයින් 36 කගෙන් රු. 4.121.081 ක් ද. විශ්‍රාම් ගිය සේවකයින් 07ක ගෙන් රු. 896.373 ක් ද. වැඩ නහනම්කල සේවකයකුගෙන් රු. 234.994 ක් ද. මියගිය සේවකයින් හතර දෙනෙකුගෙන් රු. 531.409 ක් ද වශයෙන් සේවකයින් 48 කගෙන් රු. 5.783.857 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි.

1.6.4 මූල්‍ය නොවන වත්කම්

නාවික හමුදාව සතු සුනඛයින් 28 දෙනකුගේ රු. 2.537.000 ක් වූ වටිනාකම මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	නීති. රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම්
(අ)	2018 අංක 19 දරන ජාතික විගණන පනත	
	(i) 3 හා 6 වගන්ති	ඒකාබද්ධ අරමුදල වෙත ලැබෙන සියලු ආදායම්. ඒකාබද්ධ අරමුදලෙන් වන සියලු වියදම් සහ ගිණුම් පරීක්ෂා කළ යුතු වුවද. නාවික හමුදාවේ මාලිමා සත්කාරක සේවා. මාලිමා එන්ටප්‍රයිසස්. ඉන්ධන පිරවුම්හල. කෘෂි ව්‍යාපෘති. නල් මසුන් නැරඹීමේ ව්‍යාපෘති. නිවාඩු නිකේතන ආදියේ අරමුදල්වලට අදාල ආදායම් වියදම් සම්බන්ධ ගිණුම් වාර්තා හා ලේඛණ විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

(ii) 6(3) වගන්තිය

මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව සහ විගණකාධිපතිවරයා විමසා අස්ථිත්වවල ගිණුම් විගණනය කිරීම පිණිස සුදුසුකම්ලත් විගණකවරයකු පත් කරනු ලැබිය යුතු වුවද. නාවික හමුදාවේ අරමුදල් විගණනය සඳහා පත්කර තිබූ විගණකවරයා එකී විධිවිධාන ප්‍රකාරව පත්කර නොනිබුණි.

(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

(i) මු.රෙ. වගන්තිය 101

2010 ජූලි මස 21 වන දින සිට 2011 අගෝස්තු මස 21 වන දින දක්වා කාලය තුළ ශ්‍රීලංකානෙෆ "පැරකුම්බා" ආයතනයේ ආහාර ගබඩාව වෙත සැපයුම්කරුවන් විසින් ආහාර සැපයීමේදී සහ ආහාර ගබඩාව වෙතින් මුළුතැන්ගෙයට ආහාර නිකුත් කිරීමේදී සිදු වී තිබූ රු.7,721,406 ක අලාභය සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂණ මණ්ඩල වාර්තා අනුව චරදකරුවන් 11 දෙනෙකු 2015 වර්ෂයේදී හඳුනාගෙන තිබුණි. ඉන් 04 දෙනෙකුට අදාල අලාභය නාවිකයින්ගේ සුභසාධනයේ ක්‍රියාදාම අරමුදලින් අයකර තිබුණද. ඉතිරි නාවිකයින් 07 දෙනාට අදාල අලාභය අයකර ගැනීම සඳහා කටයුතු කර නොනිබුණි.

(ii) මු.රෙ. වගන්තිය 104

පාඩුවක් හෝ අලාභ හානියක් ඇති වූ විභාග පරීක්ෂණයක් කළ යුතු වුවත්. විදේශීය මිලදී ගැනීම් අංශයේ මිලදී ගැනීම්වලින් අගය එකතු කිරීමේ බදුවලින් (VAT) නිදහස් කර තිබූ භාණ්ඩ සඳහා සැපයුම්කරුවන් වෙත අගය එකතු කිරීමේ බදු ලෙස රු.2,329,345 ක් ගෙවා නිබීම සම්බන්ධයෙන්

පවත්වන ලද පරීක්ෂණ කටයුතු අවසන් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(iii) මු.රෙ. වගන්තිය 177(1) (i) එකතුකර ගන්නා රජයේ මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කළ යුතු වුවද. නාවික නිලධාරීන්ගේ හා නාවිකයන්ගේ සුභ සාධක කටයුතු සඳහා යොදවා තිබෙන සුඛෝපභෝගී බස් රථ 04 කින් හා වෑන් රථ 02කින් නාවික හමුදාව 2022 හා 2023 වර්ෂයන් වලදී උපයා තිබූ රු. 19,880,407 ක ආදායම් නාවික හමුදාවේ සුභ සාධක අරමුදලට බැරකර නිබුණි. එම කාලපරිච්ඡේදයට අදාලව ඉන්ධන සඳහා රු. 17,113,256 ක් ද අළුත්වැඩියා වියදම් සඳහා රු. 4,486,420 ක් ද වශයෙන් රු. 21,599,676 ක වියදමක් එම වාහන වෙනුවෙන් නාවික හමුදාව විසින් දරා තිබුණි. සුභ සාධක කටයුතුවලින් ලබන ආදායමෙන් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ප්‍රමාණය පිළිබඳව ත්‍රිවිධ හමුදාව. ආරක්ෂක අමාත්‍යාංශය සහ මහා භාණ්ඩාගාරය කටයුතු කලද එහි කටයුතු අවසන් වී නොතිබුණි.

(ii) නාවික හමුදා මාලිමා සත්කාරක සේවා, මාලිමා එන්ටප්‍රයිසස්, ඉන්ධන පිරවුම්හල, තල්මසුන් නැරඹීමේ ව්‍යාපෘති, කෘෂි ව්‍යාපෘතිය, නිවාඩු නිකේතන ආදියෙන් ලබන ආදායමෙන් ඒකාබද්ධ අරමුදලට කළ යුතු බැරකිරීම් ප්‍රමාණය පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශ අනුව කටයුතු

කලද. භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීමේ කටයුතු අවසන් වී නොතිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.6 (අ) වගන්තිය

ශ්‍රී ලංකාව තුළ ඇති ශ්‍රමය, අමුද්‍රව්‍ය සහ සංරචක පිරිනමනු ලබන නිෂ්පාදනයේ (Ex work) මිලෙන් සියයට 30 වන විට හා අඩුම තරමින් ලංසු ඉදිරිපත් කළ අවස්ථාවේ සිට එම භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ / එකලස් කිරීමේ කටයුතුවල නිරත වන විට දේශීය ප්‍රමාණාවය මත සියයට 20 ක ආන්තිකයක් ලබාදිය යුතු වුවද, එක් ලංසු කරුවකු සඳහා සියයට 30 ක ආන්තිකයක් ලබාදෙමින් ඇගයීමට ලක්කර එම ලංසුකරු අවම මිල ඉදිරිපත් කළ ලංසුකරු බවට පත්කරමින් නාක්ෂණික ඇගයීම් කමිටුව එම ලංසුකරු තෝරා ගැනීම හේතුවෙන් පාරක්ෂිත පාවහන් යුගල් 3000 ක් මිලදී ගැනීමේදී රු. 2.236.500 ක් වැඩිපුර ගෙවා තිබුණි. එමෙන්ම ඇගයීමට ලක් කල පාවහන් අතරින් මෙම පාවහන් බරෙන් වැඩි බවද ගුණාත්මක භාවය අසතුටුදායක වී තිබූ බවද නිරීක්ෂණය විය.

(ඈ) අංක 07/2017 දරන 2017 දෙසැම්බර් 21 දිනැති භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02 ඡේදය

රජයට සම්බන්ධ ආයතනයකින් යතුරුපැදි 03 ක් ද, පත්අඩංගුවට ගත් වාහන 50 ක් ද වශයෙන් වූ ලියාපදිංචි අයිතියක් නොමැති වාහන හා යතුරු පැදි 53 ක් සම්බන්ධයෙන් ආරක්ෂක අමාත්‍යාංශයට කරුණු වාර්තා කර තිබුණ ද, ඒ පිළිබඳ වූ ක්‍රියාමාර්ග අවසන් වී නොතිබුණි. එම වාහනවලින් බොහොමයක් වාහන භාවිතයට ගත නොහැකි මට්ටමක පැවති බවද නිරීක්ෂණය විය.

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 දැක්ම හා මෙහෙවර

උතුරු නාවික විධානය යටතේ ඇති කොවිලාම්, ඩෙල්ෆ් සහ පේදුරු තුඩුව මුහුදු කලාප වලට 2024 ජනවාරි මස 815 සිට 1056 දක්වා ප්‍රමාණයක්ද, පෙබරවාරි මස 741 සිට 1016 දක්වා ප්‍රමාණයක්ද සහ මාර්තු මස 660 සිට 870 දක්වා ප්‍රමාණයක්ද වශයෙන් ඉන්දීය යිවර බෝට්ටු 2,216 සිට 2,942 ක් දක්වා වූ ප්‍රමාණයක් ශ්‍රී ලංකාවට අයත් මුහුදු කලාපයට ඇතුළු වී අනවසර මසුන් ඇල්ලීමේ කටයුතු අඛණ්ඩව සිදුකරනු ලබයි. 2024 වර්ෂය තුළදී යිවර යාත්‍රා 23 ක් අත්අඩංගුවට ගැනීමටද, ශ්‍රී ලංකා මුහුදු තීරයට ඇතුළු වන යිවර යාත්‍රා පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශය, යිවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය හා විදේශ කටයුතු අමාත්‍යාංශය දැනුවත් කිරීමට ද නාවික හමුදාව කටයුතු කර තිබුණද, එය වලක්වා ගැනීම සඳහා ඒකාබද්ධ වැඩ පිළිවෙලක් සකස් කිරීමට අදාල වගකිව යුතු ආයතන සමඟ එක්ව කටයුතු කිරීමට සහ රාජ්‍යතාන්ත්‍රික මට්ටමින් මැදිහත්වීමකට අවශ්‍ය කටයුතු සම්පාදනය කර නොතිබුණි.

3.2 කළමනාකරණ දුර්වලතා

3.2.1 ගබඩා පාලනය

(අ) නාවික හමුදාවේ Material digital camaflag , Material olive green, Black drill සහ Material cloth truser inner යන රෙදි වර්ග වල රෙදි මීටර් 57,014 ක් 2019 වර්ෂය අවසාන වන විට ගබඩාවේ තිබියදී සහ වාර්ෂික තොග අවශ්‍යතාවය පිළිබඳව ඇගයීමකින් තොරව 2020 සහ 2021 වර්ෂවලදී රෙදි මීටර් 164,520 ක් මිළදී ගෙන තිබුණි. 2020 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දක්වා වූ අවුරුදු 04 ක කාලය තුල එම රෙදි වර්ග වලින් රෙදි මීටර් 96,175 ක් පමණක් නිකුත්කර තිබූ අතර ඒ අනුව 2019 වර්ෂයේ සිට පැවත එන තොග වලින්ද සමන්විත වූ රෙදි මීටර් 125,359 ක පමණ තොගයක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ගබඩාවේ පැවතුණ අතර එම රෙදි වල ගුණාත්මක භාවය අඩු වී තිබුණු බවද නිරීක්ෂණය විය.

(ආ) Material Woollen Polyester dark blue 6 (A), Material woolen polyester reefer suit සහ Material wooden mess Jacket රෙදි මීටර් 18,145 ක් රු. 24,949,100 ක වටිනාකමකට 2012 වර්ෂයේදී මිලදීගෙන තිබූ අතර 2012 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුල එම අයිතමයන්ගෙන් රෙදි මීටර් 12,378 ක් පමණක් නිකුත්

වී නිබීමෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රෙදි මීටර් 5.767 ක් ගබඩාවේ පැවතුණි. විශාල තොග ප්‍රමාණයක් මිළදී ගැනීමෙන් පසු 2014 වර්ෂයේ සිට එම රෙදි වලින් නිල ඇඳුම් මැසීම නතර කිරීමට තීරණය කිරීම හේතුවෙන් අවුරුදු 11 කට වැඩි කාලයක සිට එම රෙදි තොග ගබඩාවේ ගොඩගැසී ඇති අතර ඒවායේ ගුණාත්මකභාවය ද හීන වී ගොස් තිබුණි.

(ඇ) මධ්‍යම නිළ ඇඳුම් ගබඩාවට නව කාර්ය මණ්ඩලයක් පත්කිරීමෙන් පසු 2023 ඔක්තෝබර් 31 දින කර තිබූ ගබඩා තොග සමීක්ෂණ වාර්තාව අනුව තොග අයිතම් 269 ක තොග ඒකක 9401 ක අතිරික්තයක්ද, තොග අයිතම් 227 ක තොග ඒකක 8635 ක ඌණතාවයක්ද තිබූ අතර ඒ සම්බන්ධයෙන් වූ පරීක්ෂණ කටයුතු අවසන් කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.2.2 දියතලාව නාවික නිවාඩු මධ්‍යස්ථානයේ ගාස්තු සංශෝධනය

දියතලාව නාවික නිවාඩු මධ්‍යස්ථානයේ සංචාරක නිවාසවල විදුලි හා ජල වියදම් සැලකිල්ලට ගනිමින් කාමර ගාස්තු සංශෝධනය කිරීමටත්, සංචාරක කටයුතු වලට යොදා ගන්නා වෑන් රථ හා බස් රථය සඳහා ධාවනය වන කිලෝමීටර් එකකට අයකරන ගාස්තුව එම වාහන වල නඩත්තු වියදම් හා ඉන්ධන වියදම් සැලකිල්ලට ගනිමින් සංසෝධනය කිරීමටත් කටයුතු කර නොතිබුණි.

3.2.3 රාජ්‍ය ගිණුම් පිලිබඳ කාරක සභාවේ නිරීක්ෂණ හා නියෝග ක්‍රියාත්මක කිරීම

(අ) බාහිර පාර්ශවයන්ට සැපයූ සේවා වෙනුවෙන් ඉපයූ ආදායමෙන් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට ඉතිරි වී තිබූ රු. මිලියන 337.5 කින් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට එකඟ වී තිබූ සියයට 40ක ප්‍රමාණය වන රු. මිලියන 135 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි.

(ආ) නාවික හමුදාවේ නැවිරූ සවිය සුවසහන අරමුදල ආයතන නීතිවලට අනුගත වන්නේද යන්න පිළිබඳව මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගැනීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) නාවික හමුදාව මඟින් පවත්වාගෙන යනු ලබන සියළුම ආදායම් උපයන ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කොට පවතින මූල්‍ය රෙගුලාසිවලට අනුව ක්‍රියා කිරීම සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන එහි වාර්තාවක් කාරක සභාවට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා යොමුකර නොතිබුණි.

(ඇ) නාවික හමුදාව පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර සඳහා වැය වූ ආරම්භක ප්‍රාග්ධන ප්‍රමාණය, ආදායම්, වියදම්, ලාභ හෝ අලාභ සම්බන්ධ වාර්තාවක් කාරක සභාව වෙත යොමු කිරීමට කටයුතු කර නොතිබුණි.

3.2.4 ඖෂධ හා ශල්‍ය උපකරණ මිලදී ගැනීම

(අ) ඖෂධ නොග උපයෝජනය කිරීමේ රටාව පිළිබඳ නිසි අධ්‍යයනයකින් තොරව 2023 වර්ෂයේදී පිරිවැය රු.4.073.197 ක්වූ ඖෂධ සහ ශල්‍ය උපකරණ නොග අවස්ථා 123 කදී සුළු මුදල් අග්‍රිමය මගින් මිලදී ගැනීම සඳහා කටයුතු කර නිබුණු අතර මෙම අයිතම ඒකාබද්ධ සැපයුම් හා සේවා කළමනාකරණ පද්ධතියට (ILMS) ඇතුළත් කිරීමේ කටයුතු අවසන් වී නොතිබුණි.

(ආ) රජයේ වෛද්‍ය සැපයුම් අංශයෙන් මිළදී ගත් පිරිවැය රු.1.860.619 ක්වූ ඖෂධ වර්ග 49 ක් විවිධ හේතූන්මත තවදුරටත් භාවිතා කිරීම නවතන ලෙස වෛද්‍ය සැපයුම් අංශය මඟින් ලබාදුන් උපදෙස් හේතුවෙන් මධ්‍යම ඖෂධ ගබඩාව තුළ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පැවතුණි.

(ඇ) ඖෂධ අයිතමයන්හි ශේෂය සෘණ අගයක් පෙන්වීම, සෙමින් නිකුත් වන ඖෂධ අයිතමයන් රජයේ රෝහල් අතර හුවමාරු කර ගැනීමට පහසුකම් නොමැති වීම, වැලිසර රෝහල් පද්ධතියේ Sever යන්ත්‍රයේ සබඳතාවය විටින් විට බිඳ වැටීම වැනි දුර්වලතාවයන් ඒකාබද්ධ සැපයුම් හා සේවා කළමණාකරන පද්ධතියේ පැවතුණි.

3.3 වත්කම් කළමනාකණය

ශ්‍රී ලංකා නාවික හමුදාව සතු නෞකා, බෝට්ටු, යාත්‍රා 271 කින් අක්වෙරළ නිරීක්ෂණ නෞකා 06 ක්, වේග ප්‍රහාරක නෞකා 03 ක්, වෙරළ ආරක්ෂක වේග ප්‍රහාරක යාත්‍රා 31 ක්, වේග ප්‍රහාරක මුර යාත්‍රා 11 ක්, වෙරළ නිරීක්ෂණ මුර යාත්‍රා 08 ක් මෙහි ප්‍රවාහන හා භාණ්ඩ ප්‍රවාහන යාත්‍රා 04 ක් වශයෙන් වූ නෞකා හා යාත්‍රා 63 ක් සමාලෝචිත වර්ෂය අවසාන දිනට ක්‍රියාවට පැතුණි. 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා නෞකා, බෝට්ටු, යාත්‍රා, අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් රු. 38.146.514.747 ක් වැස්තමෙන්තුගත කර නිබුණ ද, ප්‍රතිපාදන රු.17.850.651.000 ක් පමණක් ලැබී නිබීමත්, ලද ප්‍රතිපාදනවලින් රු.12.736.971.040 ක් පමණක් යොදවා නිබීමත් මෙයට ප්‍රධාන වශයෙන් බලපා නිබුණි.

04. මානව සම්පත් කළමනාකරණය

4.1 අනුමත, නථ්‍ය හා පුරප්පාඩු කාර්යය මණ්ඩලය.

සමාලෝචිත වර්ෂය අවසාන දිනට අනුමත. නථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත පරිදි විය.

සේවා වර්ගීකරණය		අනුමත සේවක සංඛ්‍යාව	නත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සේවක සංඛ්‍යාව
සේවක වර්ගය	සේවා මට්ටම්			
නාවික හමුදා පුද්ගලයින්	ජ්‍යෙෂ්ඨ	3,734	3,152	582
	තෘතියික	51,266	41,175	10,091
	එකතුව	55,000	44,327	10,673
නාවික හමුදා සිවිල් සේවක පුද්ගලයින්	ජ්‍යෙෂ්ඨ	10	8	2
	තෘතියික	13	10	3
	ද්විතියික	145	74	71
	ප්‍රාථමික	1,768	1,197	571
	එකතුව	1,936	1,289	647
	මුළු එකතුව	56,936	45,616	11,320

මේ සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදි පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ අවුරුදු 05 ක කාලපරිච්ඡේදය තුළ නිලධාරීන් සහ නාවිකයින් පිළිවෙලින් 537 දෙනෙකු හා 9,011 දෙනෙකු බඳවාගන්නා විට විශ්‍රාම හා සේවය හැර ගිය සංඛ්‍යාව පිළිවෙලින් 580 ක් සහ 17,734 ක් වී තිබුණි. ඒ අනුව නාවික හමුදාවෙන් ඉවත්ව යන සංඛ්‍යාවට සාපේක්ෂව බඳවා ගන්නා සංඛ්‍යාව සියයට 52 ක ඉතා පහත් මට්ටමක පැවතුණි.

(ආ) 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුල වාර්ෂිකව සේවය හැරගිය නිලධාරීන් සංඛ්‍යාව 16 සිට 60 දක්වාත් නාවිකයින් සංඛ්‍යාව 1,896 සිට 3,137 දක්වාත් ක්‍රමිකව වර්ධනය වී තිබුණු අතර එම වර්ෂ 5 තුල නිලධාරීන් 167 දෙනෙකු සහ නාවිකයින් 10,002 ක් සේවය හැර ගොස් තිබුණද, එය අවම කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) ශාරීරික අභ්‍යාස. නීති.නොරතුරු තාක්ෂණ. වාදක. ඉංජිනේරු. සිවිල් ඉංජිනේරු. නිත්‍ය නාවික. විශේෂ ක්‍රමය යටතේ බඳවාගත් නාවික යන අංශයන්හී 2012 වර්ෂයේ සිට 2024 ජනවාරි දක්වා වූ කාලපරිච්ඡේදය තුල ඇති වී තිබූ ඉංජිනේරු ඍන්තියේ නිලධාරීන් 68 ක්. ඉදිකිරීම් හා කාර්මික ක්ෂේත්‍රයට අදාල නාවිකයින් 3.896 ඇතුළුව විශේෂ කුසලතාවයන්ගෙන් යුත් නිලධාරීන් 90 කගේ සහ නාවිකයින් 4.103 කගේ පුරප්පාඩු පැවතුණි.

(ඈ) චැලිසර නාවික හමුදා රෝහලෙහි 2020 වර්ෂයේ සිට 2023 ජුනි මාසය දක්වා වූ කාලපරිච්ඡේදය තුලදී වාර්ෂිකව නේවාසික සහ බාහිර ප්‍රතිකාර ලැබූ රෝගීන් සංඛ්‍යාව වර්ධනය වී තිබියදී රෝහල් කාර්යය මණ්ඩලය 365 සිට 286 දක්වා අඩු වී තිබීමෙන් රෝහල් කාර්යයභාරය ඉටු කිරීමේදී කාර්යය මණ්ඩලය දැඩි වෙහෙසකට ලක් වී තිබූ බව නිරීක්ෂණය විය.

(ඉ) නාවික හමුදාවේ සේවක සංඛ්‍යාව අඩු කිරීමේ යෝජනාව සලකා බැලීමේදී නාවික හමුදාවේ කාර්යය භාරය කාර්යක්ෂමව සහ ඵලදායීව ඉටුකර ගැනීම සඳහා සිටිය යුතු සංඛ්‍යාව පිළිබඳ කරනු ලබන උපාය මාර්ගික අධ්‍යයන කටයුතු අවසන් වී නොතිබුණි.

ජේ.සුනිල් ශාන්ත

නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති වෙනුවට.